# කාර්යය සාධන වාර්තාව - 2025
# செயற்திறன் அறிக்கையும் – 2025
# Performance Report – 2025




**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මාතර**

மாவட்ட செயலகம் - **மாத்தறை**

**District Secretariat – Matara**

# 2025 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව

## දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මාතර

### වැය ශීර්ෂ අංකය 262

අන්තර්ගතය


| පරිච්ඡේදය | පිටු අංකය |
|---|---|
| 01. පරිච්ඡේදය - ආයතනික පැතිකඩ | 3-9 |
| 02. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම | 10-24 |
| 03. පරිච්ඡේදය - සමස්ත මූල්‍ය කාර්යසාධනය - 2025 | 25-45 |
| 04. පරිච්ඡේදය - කාර්යසාධන දර්ශක | 46 |
| 05. පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය | 47-53 |
| 06. පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ | 54-61 |
| 07. පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව | 62-65 |

## දිස්ත්‍රික් ලේකම්තුමාගේ පණිවිඩය .....



දිස්ත්‍රික් පරිපාලනය ශක්තිමත් කිරීම තුලින් මාතර දිස්ත්‍රික්කයේ ජනතාවට කාර්යක්ෂම හා ඵලදායි සේවයක් ඉටුකිරීම සඳහා 2025 වර්ෂය තුල රජය මගින් මාතර දිස්ත්‍රික්කය වෙත ලබාදෙන ලද ප්‍රතිපාදන තුලින් ඉටුකළ සේවාවන් කැටිකොට 2025 වර්ෂයේ කාර්යසාධන වාර්තාව එළි දැක්වීමට ලැබීම පිළිබඳ බෙහෙවින් සතුටට පත්වෙමි.

ස්වභාවික හා වෙනත් ආපදා හමුවේ මාතර දිස්ත්‍රික්කයේ ජනතාව සුරක්ෂිත කරමින් රේඛීය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා අනෙකුත් ආයතන මගින් මාතර දිස්ත්‍රික්කය වෙත වෙන් කරන ලද ප්‍රතිපාදන මාතර දිස්ත්‍රික්කයේ ජනතාවගේ සමාජ, ආර්ථික සංවර්ධනය සඳහා ඵලදායි ලෙස සහ කාර්යක්ෂමව යෙදවීමට අදාල නායකත්වය හා සම්බන්ධීකරණය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් ලබා දෙමින් අදාල  කාර්යයන් සාර්ථක ඉටු කිරීමට හැකි වී ඇත.

මුහුණදීමට සිදුවූ දිට්වා සුළිකුණාටුවෙන් මනාපෙර සූදානමින් කටයුතු කිරීම තුළින් බලපෑමට ලක් වූ ජනතාව නැවත සවිබලගැන්වීමේ කටයුතු කඩනමින් සිදු කිරීමට අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු දිස්ත්‍රික් ලේකම් කාර්යාල කාර්ය මණ්ඩලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාල කාර්ය මණ්ඩලය හා අනෙකුත් ආයතන ප්‍රධානින් සමග එක්වී සාර්ථකව සිදුකරන ලදී.

මාතර දිස්ත්‍රික්කය සංචාරක කලාපයක් ලෙස දියුණු කිරීම, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් නගා සිටුවීමට අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම, කෘෂිකාර්මික කටයුතු සඳහා නව තාක්ෂණය හඳුන්වා දෙමින් කෘෂි ඵලදායිතාවය ඉහල නැංවීමට දිරිගැන්වීමෙන් තරුණ ප්‍රජාව කෘෂිකාර්මික කටයුතු සඳහා නව තාක්ෂණය හඳුන්වාදෙමින් කෘෂි ඵලාදායිතාවය ඉහල නැංවීමට දිරිගැන්වීමෙන් තරුණ ප්‍රජාව කෘෂිකාර්මික කටයුතු සඳහා යොමු කිරීම, මිනිස් ක්‍රියාකාරකම් හා දේශගුණික විපර්යාස හේතුවෙන් සිදුවන පාරිසරික ගැටළු වලට විසඳුම් සෙවීම හා පාරිසරික සංරක්ෂණය සහ ගිං, නිල්වලා ගංගාවන්ගෙන් පෝෂණය වන ප්‍රදේශවල ගංවතුර පාලනය කර සංවර්ධනය කිරීම සහ ඩිජිටල්කරණය තුළින් මහජනතාව කාර්යක්ෂම හා ගුණාත්මක සේවාවක්  ලබාදීම යන ආයතනික කරුණු වලට ප්‍රමුඛතාවය ලබා දෙමින් ඉදිරි සංවර්ධන කටයුතු ක්‍රියාත්මක  කිරීමට සැලසුම් කර ඇත.

මෙම කාර්යසාධන වාර්තාව සැකසීම සඳහා සහාය ලබා දුන් සැමට මාගේ හෘදයාංගම ස්තුතිය පිරිනමන අතර, මාතර දිස්ත්‍රික්කය තුළ තිරසර සංවර්ධනයක් ඇති කිරීම සඳහා සැවොම එක්ව කටයුතු කිරීමේ වැදගත්කම ද අවධාරණය කරමි.

ඕ.වී. චන්දන තිලකරත්න
දිස්ත්‍රික් ලේකම්/දිසාපති,
මාතර.
2026.06.22

ඕ. වී. චන්දන තිලකරත්න
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
මාතර

# 2025 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව

# දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මාතර

## වැය ශීර්ෂ අංකය 262

## 01. පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

### 1.1. හැඳින්වීම

නිල්වලා නදී නිම්නයේ සොඳුරු පරිපාලන මධ්‍යස්ථානය ලෙස පවතින මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 කින් සමන්විත වන අතර ග්‍රාම නිලධාරී වසම් 650 කට බෙදා වෙන්කර ඇත.

දකුණු ලක මහ සයුරට මායිම්ව පිහිටි අභිමානනීය ඉතිහාසයකට උරුමකම් කියන මාතර දිස්ත්‍රික්කය උදාර අතීත ජනතාවගෙන් සැදුම්ලත් ඓතිහාසික ප්‍රදේශයකි. රෝහණ පුරවරයේ ගාල්ල හා හම්බන්තොට දිස්ත්‍රික්කයන්ට මැදිව හා රත්නපුර දිස්ත්‍රික්කයට මායිම්ව පිහිටා ඇති වර්ග කිලෝ මීටර් 1282.5 ක් හෙවත් හෙක්ටයාර් 128,250 ක භූමි ප්‍රමාණයක වපසරියකින් යුක්ත ලෝක උරුම සිංහරාජ භූමියේ කොටසක් ඇතුලත්ව සශ්‍රීක භූමි ප්‍රදේශයක් වශයෙන් මාතර දිස්ත්‍රික්කය හඳුන්වා දීම උචිත වේ. මාතර දිස්ත්‍රික්කයේ කෘෂි ආර්ථිකය මත පදනම් කර්මාන්ත ප්‍රමුඛස්ථානයෙහිලා සැලකිය හැකිය.ඒ අතරින් තේ කර්මාන්තය ප්‍රධාන වේ.

දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ජනගහන සංයුතිය පහත පරිදි වේ.

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | භූමි ප්‍රමාණය ව.කි. | ජනගහනය |
|---|---|---|
| 1. අකුරැස්ස | 145 | 59,480 |
| 2. අතුරලිය | 66 | 35,878 |
| 3. දෙව්නුවර | 36 | 54,292 |
| 4. දික්වැල්ල | 50 | 62,003 |
| 5. හක්මන | 50 | 36,104 |
| 6. කඹුරුපිටිය | 61 | 46,071 |
| 7. කිරින්ද පුහුල්වැල්ල | 39 | 22,445 |
| 8. කොටපොල | 176 | 70,342 |
| 9. මාලිම්බඩ | 44 | 41,423 |
| 10. මාතර | 53 | 129,009 |
| 11. මුලටියන | 118 | 57,705 |
| 12. පස්ගොඩ | 148 | 70,087 |
| 13. පිටබැද්දර | 135 | 58,091 |
| 14. තිහගොඩ | 52 | 36,959 |
| 15. වැලිගම | 43 | 79,838 |
| 16. වැලිපිටිය | 67 | 59,918 |
| **එකතුව** | **1,283** | **920,455** |

මුලාශ්‍රය : සම්පත් පැතිකඩ 2024 - මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

## 1.2. ආයතනයේ දැක්ම,මෙහෙවර, හා අරමුණු

**දැක්ම**

"සේවා ලාභීන් තෘප්තිමත් වන පරිදි කාර්යක්ෂම හා සඵලදායී සේවයක් සැපයීම තුළින් විශිෂ්ටත්වය කරා මාතර දිස්ත්‍රික්කය මෙහෙයවීම."

**මෙහෙවර**

"රාජ්‍ය ප්‍රතිපත්ති වලට අනුකූලව මානව, භෞතික හා මූල්‍ය සම්පත් උපායශීලීව හසුරුවමින් ජනතා හිතවාදී පරිපාලන යාන්ත්‍රණයක් බිහි කර දිස්ත්‍රික්කයේ තිරසාර සංවර්ධනයක් ඇති කරලීම."

**අරමුණු**

01. කාර්යක්ෂම හා ඵලදායී දිස්ත්‍රික් පරිපාලන ක්‍රමයක් පවත්වා ගෙන යෑම.
02. ජනතා තෘප්තිය ඉහළ නැංවෙන ආකාරයෙන් රාජ්‍ය අංශය මගින් කාර්යක්ෂම සේවා සැපයීමක් සහතික කිරීම.
03. ප්‍රතිලාභීමුඛ ආකල්ප, වගකීම්, විචක්ෂණශීලී සම්පත් භාවිතය, අපක්ෂපාතීත්වය, විනිවිදභාවය වැනි හර පද්ධතීන් රාජ්‍ය සේවය තුළ ස්ථාපිත කිරීම.
04. රාජ්‍ය අංශයේ මානව සම්පත් කළමනාකරණයට අදාල ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.
05. රාජ්‍ය නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් පිළිබඳ ප්‍රතිපත්ති වලට අනුකූල වූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
06. දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වන විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල හා අධිකාරීන් මගින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන්, ව්‍යාපෘති සංවිධානය කිරීම, මූල්‍යමය හා මූල්‍යමය නොවන සම්පත් යෙදවීම සහ පසුවිපරම් කටයුතු වල සම්බන්ධීකාරකයා ලෙස ක්‍රියා කරමින් දිස්ත්‍රික්කයේ ජනතාවගේ සුභසාධනය සහ සංවර්ධනය ඉහළ නැංවීම.
07. දිස්ත්‍රික් බල ප්‍රදේශය තුළ වෙසෙන ජනතාවගේ විවිධ වූ ආර්ථික, සමාජමය හා සංස්කෘතිකමය අවශ්‍යතාවයන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 ක් ඔස්සේ ඉටුකර දීම.
08. දිස්ත්‍රික්කයේ රජයේ නියෝජිතයා වශයෙන් ක්‍රියා කරමින් විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, රාජ්‍ය නොවන සංවිධාන වලට නිවැරදි තීරණ ගැනීම සඳහා නිවැරදි හා නිශ්චිත තොරතුරු ග්‍රාමීය හා ප්‍රාදේශීය මට්ටමින් එක්රැස් කර ඒකාබද්ධ කර සපයා දීම.
09. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඔස්සේ රජයේ විවිධ අමාත්‍යාංශ හෝ දෙපාර්තමේන්තු වෙනුවෙන් දිස්ත්‍රික්කය තුළ ඔවුන්ට හිමි ආදායම් රැස් කිරීම, ගිණුම්ගත කිරීම හා මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීම.
10. ගං වතුර, සුළි සුළං, නියඟ, මුහුද ගොඩ ගැලීම් වැනි හදිසි ආපදා අවස්ථාවන්හිදී ජනතාවට අවශ්‍ය ක්ෂණික සහන සේවාවන් සහ ආධාර ලබාදී ඔවුන්ගේ ජීවන තත්වය යථා තත්වයට පත් කිරීම.

## 1.3 ප්‍රධාන කාර්යයන්

01. දිස්ත්‍රික් ආරක්ෂක කමිටුවේ ප්‍රධානියා ලෙස ක්‍රියා කරමින් දිස්ත්‍රික් බල ප්‍රදේශය තුළ ජීවත් වන ජනතාවගේ ආරක්ෂාව තහවුරු කිරීමට ක්‍රියා කිරීම.
02. දිස්ත්‍රික්කය තුළ සංස්කෘතික, ආගමික හා වෙනත් කාලීන රාජ්‍ය උත්සව සංවිධානය කිරීමේ ප්‍රධානියා ලෙස ක්‍රියා කිරීම.
03. විමධ්‍යගත අයවැය වැඩසටහන ක්‍රියාත්මක කිරීම හා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ ලේකම් වශයෙන් ක්‍රියා කරමින් දිස්ත්‍රික්කයේ සංවර්ධන කටයුතු සංවිධානය කිරීම, ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම.
04. දිස්ත්‍රික්කය තුළ ප්‍රාදේශීය ලේකම්වරුන් 16 දෙනා සමඟ ප්‍රාදේශීය පරිපාලන කටයුතු මෙහෙයවීමේ ප්‍රධානියා ලෙස ක්‍රියා කිරීම හා එහි කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමට ක්‍රියා කිරීම.

05. පරිපාලන කටයුතු වලදී වගවීම සහ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා නවීන තොරතුරු සන්නිවේදන තාක්ෂණය යොදා ගැනීම හා ඒ සඳහා කාර්ය මණ්ඩලය උනන්දු කරවීම.

06. දිස්ත්‍රික් බල ප්‍රදේශය තුළ සියලුම අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වල නියෝජ්‍ය ප්‍රධානියා ලෙස ක්‍රියා කරමින් ඒ ඒ ආයතන වල අරමුණු පරමාර්ථ හා කාර්යයන් ඉටුවන පරිදි සම්බන්ධීකරණ කටයුතු කිරීම.

07. සියලුම මැතිවරණ කටයුතුවලදී එනම් ජනාධිපතිවරණය, පාර්ලිමේන්තු මැතිවරණය, පළාත් සභා මැතිවරණය හා පළාත් පාලන මැතිවරණ වලදී දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී ලෙස ක්‍රියා කරමින් සාධාරණ හා අපක්ෂපාතී මැතිවරණ පැවැත්වීමට ක්‍රියා කිරීම.

08. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල කාර්ය මණ්ඩල නිලධාරීන්ගේ අභිප්‍රේරණ සහ හැකියා වර්ධනයට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

09. විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සම්බන්ධ ආදායම් ගණන් දීමේ නිලධාරීන් වෙනුවෙන් ඔවුන්ගේ ආදායම් එක්රැස් කිරීම, ගිණුම්ගත කිරීම හා භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීම සහ අදාළ ආදායම් ගණන්දීමේ නිලධාරීන් දැනුවත් කිරීම.

10. මුහුද ගොඩගැලීම, නියඟ, ගං වතුර, සුළි සුළං වැනි විස්තීර්ණ ආපදා අවස්ථාවන්හිදී රජයේ නියෝජිතයා ලෙස ක්‍රියා කරමින් ආපදා කළමනාකරණ කටයුතු සංවිධානය කිරීම, ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය හා පසුවිපරම් කටයුතු කිරීම තුලින් ජන ජීවිතය යථා තත්වයට පත් කිරීම හා ස්ථාවර කිරීම.

11. විදේශාධාර ව්‍යාපෘති හා දේශීය අරමුදල් ව්‍යාපෘති සුපරීක්ෂණය හා අධීක්ෂණය මගින් වත්කම් කළමනාකරණ පද්ධති සංවර්ධනය කිරීම.

## 1.4. සංවිධාන සටහන



දිස්ත්‍රික් ලේකම්තුමා
අධ්‍යක්ෂ සැලසුම්
අධ්‍යක්ෂ සමෘද්ධි
අති.දි.ලේ. -පාලන
අති.දි.ලේ. -ඉඩම්
දිස්. ඉංජිනේරු
ප්‍රධාන ගණකාධිකාරී
ප්‍රධාන අභ්‍යන්තර විගණක
සහකාර අධ්‍යක්ෂ සැලසුම්
සහකාර දිස්ත්‍රික් ලේකම්
සහකාර අධ්‍යක්ෂ ආපදා
ගණකාධිකාරී
සංඛ්‍යාලේඛණඥ
සහකාර අධ්‍යක්ෂ පළාත්
සහකාර අධ්‍යක්ෂ කුඩා ව්‍යාපාර
අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්
භාෂා පරිවර්තක
පරිපාලන නිලධාරී
ජ්‍යෙෂ්ඨ මෝටර්රථ වාහන පරීක්ෂක
සමෘද්ධි කළමණාකරු
කාර්ය භාර නිලධාරී
සංඛ්‍යාලේඛණ නිලධාරී
දිස්ත්‍රික් සංස්කෘතික නිලධාරී
ජ්‍යෙෂ්ඨ විමර්ශණ නිලධාරී
ව්‍යාපාර සංවර්ධන නිලධාරී
වෘත්තීය මාර්ගෝපදේශණ නිලධාරී
මානව සම්පත් සම්බන්ධීකාරක
සංවර්ධන සම්බන්ධීකාර
රේඛීය අමාත්‍යාංශ නිලධාරීන්
බෞද්ධ කටයුතු සම්බන්ධීකාරක
පරිසර නිලධාරී
මෝටර්රථ වාහන පරීක්ෂක
අංශ ප්‍රධානී
අංශ ප්‍රධානී
අංශ ප්‍රධානී
ප්‍රධාන ලිපිකරු
අංශ ප්‍රධානී
මුදල් සහකාර
කළමනාකරණ සහකාර
සංවර්ධන නිලධාරී
කළමනාකරණ සහකාර
සංඛ්‍යාලේඛණ සහකාර
කළමනාකරණ සහකාර
සංවර්ධන නිලධාරී
පරිගණක දත්ත ඇතුලත් කිරීමේ ක්‍රියාකරු
කළමනාකරණ සහකාර
සංවර්ධන නිලධාරී
පරිගණක දත්ත ඇතුලත් කිරීමේ ක්‍රියාකරු
කළමනාකරණ සහකාර
තාක්ෂණ නිලධාරී
කළමනාකරණ සහකාර
කෙටුම්පත්කරු
සංවර්ධන නිලධාරී
අයවැය සහකාර
සංවර්ධන නිලධාරී
කළමනාකරණ සහකාර
පරිගණක දත්ත ඇතුලත් කිරීමේ ක්‍රියාකරු
සංවර්ධන නිලධාරී
කළමනාකරණ සහකාර
කාර්යාල කාර්යය සහායක
රියදුරු
කාර්යාල කාර්යය සහායක
රියදුරු
කාර්යාල කාර්යය සහායක
කාර්යාල කාර්යය සහායක
රියදුරු
කාර්යාල කාර්යය සහායක
කාර්යාල කාර්යය සහායක
රියදුරු
කාර්යාල කාර්යය සහායක
රියදුරු
කාර්යාල කාර්යය සහායක

**1.5 අමාත්‍යාංශ යටතේ පවතින දෙපාර්තමේන්තු / දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල**

1. අකුරැස්ස
2. අතුරලිය
3. දෙව්නුවර
4. දික්වැල්ල
5. හක්මණ
6. කඹුරුපිටිය
7. කිරින්ද පුහුල්වැල්ල
8. කොටපොල
9. මාලිම්බඩ
10. මාතර
11. මුලටියන
12. පස්ගොඩ
13. පිටබැද්දර
14. තිහගොඩ
15. වැලිගම
16. වැලිපිටිය

# මාතර දිස්ත්‍රික්කයේ පිහිටීම



## 1.6. අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/පළාත් සභාව යටතේ පවතින ආයතන/අරමුදල්

ලැබී නොමැත.

## 1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

ලැබී නොමැත.

# 02. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් විවිධ අංශ යටතේ 2025 වර්ෂය තුල සිදුකරන ලද ක්‍රියාකාරකම් තුලින් සාර්ථක ප්‍රගතියක් අත්කරගෙන ඇත. විවිධ අමාත්‍යාංශ යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලැබුණු ප්‍රතිපාදන සහ රාජ්‍ය පරිපාලන, පලාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය යටතේ ලද ප්‍රතිපාදන මනාව උපයෝජනය කිරීම සහ ආයතනයේ මානව සහ භෞතික සම්පත් මනා කළමනාකරණය තුලින් මෙම ප්‍රගතිය අත්කර ගැනීමට හැකිවී ඇත. මෙහිදී එක් එක් අංශය යටතේ ලබාගත් සුවිශේෂ ජයග්‍රහණ, සිදුකරන ලද කාර්යයන් හි ප්‍රගතිය සහ ඉදිරි ඉලක්ක පහත දක්වා ඇත.

## 2.1 ප්‍රගතිය හා ජයග්‍රහණ

### 2.1.1 සැලසුම් අංශය මගින් සිදු කල සුවිශේෂී කාර්යයන් හා ජයග්‍රහණ

- **දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු පැවැත්වීම**

රජයේ සංවර්ධන කාර්යයන් නව ප්‍රවේශයක් ඔස්සේ හඳුනාගැනීම, සැලසුම් කිරීම, මෙහෙයවීම, සුපරීක්ෂණය , ප්‍රගති සමාලෝචනය සහ ඇගයීම සඳහා රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ දක්වා ඇති අරමුණ පෙරදැරිව 2025 වර්ෂයේ දී දිස්ත්‍රික් හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු ව්‍යුහය විධිමත් කිරීම සිදුකරනු ලැබූ අතර මාතර දිස්ත්‍රික්කයේ ද මෙම කටයුතු සාර්ථකව සිදුකෙරිණි.

මේ යටතේ 2025 වර්ෂය සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු 11 ක් පැවැත්වීම තුලින් දිස්ත්‍රික්කයේ සංවර්ධන කටයුතු වේගවත් කිරීමට අවශ්‍ය තීන්දු තීරණ ගැනීමට හැකියාව ලැබුණි. ඒ අනුව 2025.ජනවාරි 17, පෙබරවාරි 21, මාර්තු 28, මැයි 21, ජුනි 13, ජූලි 11, ජූලි 25, අගෝස්තු 26, ඔක්තෝබර් 01, නොවැම්බර් 04, දෙසැම්බර් 09 යන දිනයන් හි සම්බන්ධීකරණ කමිටු පවත්වා ඇත.

2025.07.11 දින විශේෂ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවක් ශ්‍රී ලංකා අතිගරු ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විය.

එසේම මාතර දිස්ත්‍රික්කය තුල මාර්ග ආරක්ෂණ අනු කමිටුව , ප්‍රවාහන අනු කමිටුව, සහ සැලසුම් අනු කමිටුව 2025 වර්ෂය තුල පවත්වා ඇත.

- **2025 වර්ෂය තුල පවත්වනු ලැබූ මාතර දිස්ත්‍රික් අනු කමිටු පිලිබඳ විස්තර**

| කමිටුවේ නම | අරමුණ | පැවැත්වූ දින |
|---|---|---|
| මාර්ග ආරක්ෂණ උපායමාර්ග සම්බන්ධ කමිටු රැස්වීම | මාතර දිස්ත්‍රික්කය තුල මාර්ග ආරක්ෂාව සම්බන්ධයෙන් ඵලදායි වැඩසටහනක් සැකසීම මෙහි අරමුණ වේ. මාතර දිස්ත්‍රික්කය තුල අනාරක්ෂිත මාර්ග හා ස්ථාන හඳුනා ගැනීම තුලින් ප්‍රවාහනයට සම්බන්ධ ක්ෂේත්‍රයන් සමඟ සම්බන්ධ වී විසඳුම් සෙවීම මෙමගින් සිදුවේ. | 2025.09.18<br>2025.10.03 |
| ප්‍රවාහන කමිටුව | 2025 වර්ෂයේ ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධනයට අදාලව මාතර දිස්ත්‍රික්කය තුල පවතින ගැටළු හා යෝජනා සම්බන්ධව දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය මට්ටමින් ගැටළු හඳුනාගෙන එම ගැටළු හා යෝජනා අදාළ නිලධරීන් සමඟ සාකච්ඡා කර විසඳුම් ලබාදීම මෙහි අරමුණ වේ. | 2025.03.10<br>2025.03.28<br>2025.07.01 |
| සැලසුම් කමිටුව | අදාළ වර්ෂය තුල මාතර දිස්ත්‍රික්කයේ තිබෙන සියලුම රාජ්‍ය ආයතනවල වැය ශීර්ෂයන් යටතේ සිදු කරනු ලබන සියලුම සංවර්ධන ව්‍යාපෘති වැඩසටහන් පිලිබඳ ප්‍රගතිය ලබාගැනීම සහ සාකච්ඡා කිරීම. | 2025.10.31<br>2025.11.27 |

- **විවිධ අමාත්‍යංශ / දෙපාර්තමේන්තු මගින් සිදු කල සංවර්ධන ව්‍යාපෘති -2025**

| අරමුදල් මූලාශ්‍රය (අමාත්‍යාංශය, Ministry/දෙපාර්තමේන්තුව, Department) | වැය ශීර්ෂය | ව්‍යාපෘතිය | ව්‍යාපෘති සංඛ්‍යාව | ඇස්තමේන්තුගත මුළු පිරිවැය (රු.මි) | 2025 සඳහා වෙන්කළ මුදල (රු.මි) | 2025.12.31 දින වන විට වැඩ අවසන් කළ ව්‍යාපෘති සංඛ්‍යාව | 2025.12.31 දිනට වියදම (රු.මි) |
|---|---|---|---|---|---|---|---|
| මුදල් හා ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 237-1-02-001-2509 | විමධ්‍යගත අයවැය වැඩසටහන | 53 | 78.95 | 80.00 | 53 | 74.08 |
| මුදල් හා ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 262-1-1-14-2509 | දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන | 56 | 76.00 | 76.00 | 56 | 72.15 |
| ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශය | 117-2-4-61-2104 | ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන | 53 | 95.83 | 95.83 | 52 | 89.44 |
| ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශය | 117-2-4-67-2104-546 | | 17 | 33.60 | 33.60 | 11 | 20.09 |
| නිවාස ඉදිකිරීම් හා ජලසම්පාදන අමාත්‍යාංශය | 123-2-27-003-2202-11 | පාසල් සනීපාරක්ෂක පහසුකම් ලබාදීමේ වැඩසටහන | 18 | 7.65 | 7.65 | 18 | 7.42 |
| ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජාසවිබලගැන්වීමේ අමාත්‍යාංශය | 124-02-05-001-2202 | ග්‍රාමීය සංවර්ධන වැඩසටහන | 15 | | 23.42 | 15 | 22.07 |
| ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජාසවිබලගැන්වීමේ අමාත්‍යාංශය | 124-02-05-001-2202 | ප්‍රජා ශක්ති වැඩසටහන | 17 | | 19.60 | 17 | 19.2 |
| බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික අමාත්‍යාංශය | 101-2-6-8-2205 | ග්‍රාමීය විහාරස්ථාන සංවර්ධනය | 5 | 2.50 | 2.50 | 5 | 2.45 |
| බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික අමාත්‍යාංශය | 101-2-6-8-2206 | ආපදාවට පත් විහාරස්ථාන සංවර්ධනය | 3 | 1.50 | 1.50 | 3 | 1.47 |
| මුස්ලිම් හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | 202-2-1-7-2205 | මුස්ලිම් සංස්කෘතික මධ්‍යස්ථාන ඉදි කිරීම හා පල්ලි වැඩි දියුණු කිරීම | 1 | 0.40 | 0.40 | 1 | 0.39 |
| බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව | 201-2-2-8-2205 | ඌණ සංවර්ධිත දහම්පාසල් සඳහා දහම් පාසල් උපකරණ ලබා දීම | 56 | 5.30 | 5.30 | 56 | 5.25 |
| විදේශ කටයුතු විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යංශය | 112-2-14-2202-017 | සංචාරක සංවර්ධන ව්‍යාපෘති | 9 | 60.24 | 60.24 | 5 | 25.61 |

| අරමුදල් මූලාශ්‍රය (අමාත්‍යාංශය, Ministry/දෙපාර්තමේන්තුව, Department) | වැය ශීර්ෂය | ව්‍යාපෘතිය | ව්‍යාපෘති සංඛ්‍යාව | ඇස්තමේන්තුගත මුළු පිරිවැය (රු.මි) | 2025 සඳහා වෙන්කළ මුදල (රු.මි) | 2025.12.31 දින වන විට වැඩ අවසන් කළ ව්‍යාපෘති සංඛ්‍යාව | 2025.12.31 දිනට වියදම (රු.මි) |
|---|---|---|---|---|---|---|---|
| ක්‍රීඩා අමාත්‍යාංශය | 219-02-02-035-2509 | ක්‍රීඩා පිටි සංවර්ධනය | 6 | 12.34 | 12.34 | 6 | 10.96 |
| අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 289-02-01-2104 | මාපලාන මධ්‍යම පැලතවානේ කාන්තා වැසිකිළිය සහ සේදුම් කාමරය ඉදිකිරීම | 1 | 1.00 | 1.00 | 1 | 0.97 |
| කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය | 149-2-3-2-2506 | උඩුකාව කර්මාන්තපුර යට අදාළ ආරක්ෂිත දැල්වැටෙහි ඉතිරි කොටස් සකස් කිරීම | 1 | 1.16 | 1.16 | 1 | 0.901 |
| වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය | 135-2-17-3-2507/ 135-2-19-6-2202/ 135-2-19-1-2104 | වැලිගම පොල්කොළ මැලවීමේ හා කුණුවීමේ රෝග මර්දන වැඩසටහන | 6429 (පොල්ගස් වන්දි) | | 33.32 | 6429 | 32.81 |
| එකතුව | | | 6740 | 376.47 | 453.86 | 6729 | 385.26 |

**විමධ්‍යගත අයවැය වැඩසටහන**






**පාසල් සනීපාරක්ෂක පහසුකම් ලබාදීමේ වැඩසටහන**




**ක්‍රීඩා සංස්කෘතියක් බිහි කිරීම (පාසල් හා මහජන ක්‍රීඩාංගන)**




- **සංචාරක සංවර්ධන ව්‍යාපෘති - 2025**

සංචාරක සංවර්ධන ව්‍යාපෘති අදාලව ව්‍යාපෘති 07ක් ක්‍රියාත්මක වූ අතර ඒ සඳහා රු. මිලියන 40 ප්‍රතිපාදන මත සංවර්ධන ව්‍යාපෘති 5 ක කටයුතු 2025 වර්ෂය තුල සම්පූර්ණයෙන් නිම කිරීමට හැකියාව ලැබුණි. 2025 වර්ෂය තුල නිම කල නොහැකිවූ ව්‍යාපෘති දෙකක් 2026 වර්ෂය සඳහා අවිච්ඡේද කිරීමට සිදුවිය.

| ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය | ව්‍යාපෘතිය | අනුමත ප්‍රතිපාදන ලැබීම් රු: (මි) | සත්‍ය වියදම රු: (මි) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| වැලිගම | මිරිස්ස උඩුපිල මහ ඇල පිරිසිදු කිරීම හා ගේබියන් බැමි යෙදීම. | 9.8 | 1.29 | 15% |
| | මිරිස්ස සුනන්දාරාම පාරේ කාණු පද්ධතිය ඉදිකිරීම | 9.69 | 7.58 | 80% |
| කොටපොල | දෙනියාය - කොටපොල (මහජන පුස්ථකාලය අසල) සංචාරක කලාපයේ සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම. | 2.58 | 1.98 | වැඩ අවසන් |
| දික්වැල්ල | පීටර් ප්ලේස් සිට වටරවුම පාර පියුමි හවුස් දක්වා මාර්ග කොටස සංවර්ධනය කිරීම මී.230 | 6.9 | 6.5 | වැඩ අවසන් |
| | නිල්වැල්ල සමගිපුර බුදු පිළිම අසල සිට (පියරත්න මාවත) පීටර් ප්ලේස් මාර්ග කොටස සංවර්ධනය කිරීම.අදියර 1 හිල්ටොප් හෙවන් සිට කෝ හවුස් දක්වා | 4.5 | 2.88 | වැඩ අවසන් |
| මාතර | පොල්හේන - මඩිහ මාර්ගයේ කාණු පද්ධතිය (මීටර් 120) | 3.87 | 3.26 | වැඩ අවසන් |
| | පොල්හේන මාර්ගයේ කාණු පද්ධතිය (මීටර් 140) | 2.84 | 2.08 | වැඩ අවසන් |




### 2.1.2. ක්ෂේත්‍ර අංශය මගින් සිදු කල සුවිශේෂී කාර්යයන් හා ලද ජයග්‍රහණ

මිනිස් බල හා රැකි රක්ෂා දෙපාර්තමේන්තුව, සමාජ සේවා දෙපාර්තමේන්තුව හා JAICA ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වන ESPD ව්‍යාපෘතිය යටතේ 2023 / 2024 / 2025 වර්ෂයන්හි ආබාධිත රැකියා ගත කිරීම් අංශයෙන්ම සමස්ථ වැඩිම ප්‍රගතිය මාතර දිස්ත්‍රික්කය තුලින් වාර්ථා කිරීම.

- ව්‍යවසාය සංවර්ධන කටයුතු ( NEDA ) විෂයට අදාළව Made in Sri Lanka Logo- මාතර දිස්ත්‍රික්කය සඳහා අවස්ථා 15 ක් ලැබීම.





Made in Sri Lanka වෙළඳ ප්‍රදර්ශනය - 2025 - කුටි 138 කින් සමන්විත වූ වෙළඳ ප්‍රදර්ශන භූමියේ ව්‍යවසායකයින් 146 ක් සඳහා අවස්ථාව ලබා දීම.




### 2.1.3. 2025 වර්ෂයේ කෘෂිකර්ම අංශය සිදු කල සුවිශේෂී කාර්යයන් හා ලද ජයග්‍රහණ

- **මාතර දිස්ත්‍රික්කය සඳහා වාර්ෂික කෘෂිකාර්මික සැලැස්ම සකස් කිරීම**

කෘෂිකර්ම අමාත්‍යාංශයේ උපදෙස් පරිදි 2025 වර්ෂය සඳහා යළ හා මහ කන්න දෙකකට අදාළව වී, අතිරේක ආහාර බෝග, එළවළු හා පළතුරු සඳහා ගොවිජන සංවර්ධන බලප්‍රදේශ මට්ටමෙන් ලබාගන්නා තොරතුරු අනුව සකස් කරන ලද වාර්ෂික කෘෂිකාර්මික සැලැස්ම නියමිත දිනට පෙර කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත ලබාදීම කලයුතු අතර අනුව එක් එක් කන්නය තුල පවතින මාසික ප්‍රගතිය දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේදී සමාලෝචනයට බඳුන් කර ඇත.

- **දිස්ත්‍රික් කෘෂිකර්ම කටිමු රැස්වීම් සංවිධානය, පැවැත්වීම, හා වාර්තා සැකසීම**

2025 වර්ෂය සඳහා දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටු මාසික රැස්වීම් 07 ක් පවත්වා ඇත. වාරිමාර්ග සහ අනෙකුත් කෘෂිකාර්මික ගැටළු පිළිබඳව සාකච්ඡා කොට ඒවා සඳහා විසඳුම් ලබාදීමට අදාලවන ආයතනික දායකත්වය සැපයීමට කටයුතු කර ඇත. එහිදී පැන නඟින ගැටළු පිළිබඳව සාකච්ඡා කොට ඒවා සඳහා විසඳුම් ඉදිරිපත් කිරීමට තවත් අතුරු රැස්වීම් රාශියක්ද සංවිධානය කරමින් එම ගැටළු සඳහා විසඳුම් ලබාදීමට දායක වී ඇත. ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටු වලින් පැන නඟින ගැටළු සඳහා විසඳුම් ඉදිරිපත් කිරීමටත්, ජාතික වැඩසටහන්වල මාසික ප්‍රගතිය විමර්ෂණය කරමින් එම වාර්ෂික සැලැසුම්වල ඉලක්ක සාක්ෂාත් කර ගැනකීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත.

- **2025 යල සහ 2025/26 මහ කන්නවල වී වගා කටයුතු සාර්ථක කර ගැනීම සඳහා දායකවීම**

ගොවිජන සංවර්ධන දෙපාර්මේන්තුව, මහා වාරිමාර් දෙපාර්මේන්තුව, පළාත් වාරිමාර්ග දෙපාර්මේන්තුව, කෘෂිකර්ම දෙපාර්මේන්තුව, ජාතික පොහොර ලේකම් කාර්යාලය සහ ගොවි සංවිධාන නියෝජිතයින් ඒකරාශීකොට ගෙන ඉහත කන්න සඳහා දිස්ත්‍රික් ලේකම් ගේ ප්‍රධානත්වයෙන් වාරිමාර්ග ව්‍යාපාර 06 කට අයත් කන්න රැස්වීම් 06 ක් සංවිධානය , සහභාගිවීම, වාර්තා සැකසීම එමඟින් ඉදිරිපත් වන ගැටළු සඳහා විසඳුම් ලබාදීමට අදාළ වන කාර්යයන් සිදු කිරීමට හැකිවිය. තවද, දිස්ත්‍රික්කයේ සියළුම කන්න රැස්වීම් වාර්තා ලබාගෙන එක් එක් කන්නය සඳහා වී වගා රක්ෂණ මෙහෙයුම් කාලසටහන සකස් කිරීම සහ වගා හානි සඳහා වන්දි ලබාදීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ප්‍රගතිය සාකච්ඡාකිරීමට කටයුතු කර ඇත.

- **2025 අයවැය ඇස්තමේන්තු යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම - ආහාර සුරක්ෂිතාවය හා තාක්ෂණ වැඩසටහන**

කෘෂිකර්ම අමාත්‍යාංශ ප්‍රතිපාදන මඟින් මාතර දිස්ත්‍රික්කයේ ආහාර සුරක්ෂිතාවය හා තාක්ෂණ වැඩසටහන යටතේ ව්‍යාපෘති 04 ක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 11 ක සාර්ථකව ක්‍රියාත්මක කර ඇත. ඒ අනුව, කඹුරුපිටිය, කිරින්ද පුහුල්වැල්ල, දික්වැල්ල, අකුරැස්ස, හක්මණ, පස්ගොඩ යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 06 **"වාණිජ මට්ටමෙන් අන්නාසි වගාව ව්‍යාප්ත කිරීම තුළින් මාතර දිස්ත්‍රික්කයේ ආහාර සුරක්ෂිතතාවය ඉහළ නැංවීම"** යන ව්‍යාපෘතිය ප්‍රතිලාභීන් 109 ක් සඳහා රුපියල් මිලියන 2.193101 රජයේ දායකත්වය යටතේ අන්නාසි පැල 36,309 ක් ලබා දී ඇත, එම අන්නාසි වගාවන් සාර්ථකව නඩත්තු කරමින් පවතී.

කඹුරුපිටිය, කිරින්ද පුහුල්වැල්ල, දික්වැල්ල, වැලිගම, වැලිපිටිය යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 05 **"ඇම්බන් කෙසෙල් වගාව ප්‍රවර්ධනය තුළින් මාතර දිස්ත්‍රික්කයේ පලතුරු නිෂ්පාදනය ඉහළ නැංවීම"** යන ව්‍යාපෘතිය ප්‍රතිලාභීන් 190 ක් සඳහා රුපියල් මිලියන 0.8563585 රජයේ දායකත්වය යටතේ ඇම්බන් කෙසෙල් පැල 4,533 ක් ලබා දී ඇත, එම කෙසෙල් වගාවන් සාර්ථකව නඩත්තු කරමින් පවතී.

අකුරැස්ස, අතුරලිය, තිහගොඩ යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 03 **"වැල් දොඩම් වගාව ප්‍රචලිත කිරීම තුළින් මාතර දිස්ත්‍රික්කයේ පලතුරු වගාව ප්‍රවර්ධනය කිරීම"** යන ව්‍යාපෘතිය ප්‍රතිලාභීන් 27 ක් සඳහා රුපියල් මිලියන **1.143609** රජයේ දායකත්වය යටතේ වැල් දොඩම් පැල 1175 ක්, දැව කණු 1290 ක්,

ගේජ් 12 ප්ලාස්ටික් කෝඩඩ් වයර් රෝල් 27 ක් ලබා දී ඇත, එම වගාවන් සාර්ථකව නඩත්තු කරමින් පවතී.

අතුරලිය, මාතර යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 02 **"වන සත්ත්ව හානිය පාලනය මඟින් දිස්ත්‍රික්කයේ බෝග නිෂ්පාදනය ඉහළ නැංවීම"** යන ව්‍යාපෘතිය ප්‍රතිලාභීන් 76 ක් සඳහා රුපියල් මිලියන 0.674265 රජයේ දායකත්වය යටතේ වායු රයිෆල් 21 , වගා ආරක්ෂිත දැල් 11 (50x2.5m) 44 (100x2.5m) ලබා දී ඇත.

- **පුරන් කුඹුරු අස්වැද්දීම - 2025**

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශ ප්‍රතිපාදන මඟින් **පුරන් කුඹුරු අස්වැද්දීම -2025** වැඩසටහන රු. මි. 16.561 යටතේ මාතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 15 ක් තුල ගොවිජන සේවා බල ප්‍රදේශ 21 ක මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. ගොවිජන සංවර්ධන දෙපාර්මේන්තුව මඟින් වැඩ යෝජනා ඉටු කරන ලද අතර මෙහිදී ක්‍රියාත්මක වූ ව්‍යාපෘති යෝජනා 88 ක් සඳහා රු.මි 16.5 වැය කර ඇත.

- **අත්‍යවශ්‍ය වාරිමාර්ග ප්‍රතිසංස්කරණ වැඩයෝජනා ක්‍රියාත්මක කිරීම 2025**

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශ ප්‍රතිපාදන මඟින් රු. මි 20.1ක ප්‍රතිපාදන ප්‍රමාණයක් අත්‍යාවශ්‍ය වාරිමාර්ග ප්‍රතිසංස්කරණ වැඩයෝජනා ක්‍රියාත්මක කිරීම - 2025 වෙන්කල අතර ඉන් **රු.මි. 19.1** ක ප්‍රතිපාදන මාතර, මාලිම්බඩ, මුලටියන, වැලිගම, අකුරැස්ස, කඹුරුපිටිය, දික්වැල්ල, අතුරලිය හා පස්ගොඩ යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වෙ යොමු කරන ලදී.

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 08 ක වැඩ යෝජනා 21 ක් සම්පූර්ණයෙන්ම අවසන් වී ඇති අතර එහි වියදම **රු.මි. 13.44246062** ක් වූ අතර අයහපත් කාලගුණික තත්වය හේතුවෙන් කඹුරුපිටිය ප්‍රතිසංස්කරණ යෝජනාව ක්‍රියාත්මක නොවූ අතර අකුරැස්ස ප්‍රතිසංස්කරණ වැඩ යෝජනාව අවිච්ඡේදනය විය.

- **අස්වනු සමීක්ෂණ වැඩසටහන - 2025**

දිස්ත්‍රික් ලේකම්ගේ මෙහෙයවීම මඟින් සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වල අස්වනු සමීක්ෂණ 446 ක් සිදු කරන ලදී. මෙහිදී ශ්‍රම දායකත්වය වෙනුවෙන් රු**.මි. 0.46096** ක මුදලක් කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශ මඟින් වෙන් කර ඇත.

- **කෘෂිකාර්මික හා කර්මාන්ත අංශයේ තරුණ ව්‍යවසායකයින් සංවර්ධනය කිරීම ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම**

කෘෂිකර්මය හා ඒ ආශ්‍රිත කෘෂිකර්මාන්තය පදනම් කර ගත් ව්‍යාපාර ආරම්භ කිරීමට මුලපුරන, සුළු හා මධ්‍ය පරිමාණ තරුණ ව්‍යවසායකයින් සඳහා මූලික ප්‍රාග්ධන අවශ්‍යතාවය සපුරාලීම සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබීය. ණය ලබාදීමේ නිර්ණායක ඇතුලත් කරමින් පොලී අනුපාතය හිඟ මුදලින් සීයයට හතරක් (4%) ලෙසත් උපරිම මිලියන 5.0 නොයික්මවා ණය මුදල් ලබාදීම මෙම ව්‍යාපෘතිය යටතේ සිදුවිය. මෙහිදී මාතර දිස්ත්‍රික්කය වෙනුවෙන් සියළුම ප්‍රා දේශීය ලේකම් කොට්ඨාස වෙනුවෙන් රු.මි. 183 ක ණය මුදලක් වෙනුවෙන් ව්‍යාපෘති යෝජනා 88 ක් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇති අතර කඹුරුපිටිය සහ පස්ගොඩ ප්‍රතිලාභීන් සඳහා රු.මි 7.156 ක ණය මුදලක් බැංකු මඟින් නිදහස් කර ඇත.

- **2025 වර්ෂයේ දිස්ත්‍රික් මට්ටමෙන් පුහුණු වැඩමුළු පැවැත්වීම**

කෘෂිකර්ම අමාත්‍යාංශ ප්‍රතිපාදන මඟින් මාතර දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 හි රාජකාරියේ නියුතු කෘෂිකර්ම, පශුසම්පත්, ග්‍රාමීය ආර්ථික යන අංශ වල

සංවර්ධන නිලධාරීන් 73 ක් සඳහා රජයේ දායකත්වය රුපියල් මිලියන 0.10645 ක වියදමින් "**AI තාක්ෂණය හා ඩ්‍රෝන තාක්ෂණය** " පිළිබද පුහුණු වැඩසටහනක් දින 02 ක් තුල පවත්වා ඇත.

### 2.1.4. 2025 වර්ෂයේ ක්‍රීඩා අංශය ලද ජයග්‍රහණ

| අනු අංකය | ක්‍රීඩකයා / ක්‍රීඩිකාවගේ නම | තරඟ ඉසව්ව | ක්‍රීඩා උළෙලේ නම | ලබා ගත් ස්ථානය |
|---|---|---|---|---|
| 1. | දිනෙත් ඉඳුවර වීරරත්න (2025 වර්ෂයේ ජාතික සංචිතය නියෝජනය කරන ලදී.) | මීටර් 100*4 | ඩුබායිහි පැවති Grand Prix තරඟාවලිය | සිව්වන ස්ථානය |
| | | මීටර් 100*4 | ආසියානු මලල ක්‍රීඩා ශූරතා තරඟාවලිය | සහභාගිත්වය |
| | | මීටර් 100 | දෙවන ජාතික තේරීම් තරඟ | දෙවන ස්ථානය |
| | | මීටර් 100*4 | 49 වන ජාතික මහා ක්‍රීඩා උළෙල | දෙවන ස්ථානය |
| | | මීටර් 100 | පළමු ජාතික තේරීම් තරඟ | සිව්වන සථානය |
| | | මීටර් 60 | පළමු ජාතික කෙටි ධාවනපථ මලල ක්‍රීඩා ශූරතා තරඟාවලිය | තෙවන ස්ථානය |
| | | මීටර් 20*4 | අන්තර් රෙජිමේන්තු සහය දිවීමේ සැණකෙළිය | ප්‍රථම ස්ථානය |
| | | මීටර් 200*4 | අන්තර් රෙජිමේන්තු මලල ක්‍රීඩා උළෙල | දෙවන ස්ථානය |
| | | මීටර් 100*4 | ආරක්ෂක සේවා මලල ක්‍රීඩා ශූරතාවලිය | ප්‍රථම ස්ථානය |
| 02. | එම්.ජී.ජී. සදිල රශ්මික | මීටර් 110 කඩුළු | ජාතික කණිෂ්ඨ ක්‍රීඩා උළෙල | දෙවන ස්ථානය |
| | | මීටර් 100*4 | 49 වන ජාතික මහා ක්‍රීඩා උළෙල | දෙවන ස්ථානය |
| | | මීටර් 110 කඩුළු | සමස්ථ ලංකා පාසල් තරග | තෙවන ස්ථානය |
| 03. | ටී.එච්.රුසිත් නිම්සර (ආසියානු යොවුන් ක්‍රීඩා උළෙල නියෝජනය කිරීම.) | දුර පැනීම | ජාතික කණිෂ්ඨ ක්‍රීඩා උළෙල | ප්‍රථම ස්ථානය |
| | | දුර පැනීම | දකුණු පළාත් පාසල් ක්‍රීඩා උළෙල | දෙවන ස්ථානය |
| 04. | කේ.පී.ටී.එම්. නිර්මාණි (දක්ෂතම ක්‍රීඩිකාව) | දුර පැනීම | ජාතික කණිෂ්ඨ මලල ක්‍රීඩා ශූරතාවලිය | දෙවන ස්ථානය |
| | | උස පැනීම | දකුණු පළාත් පාසල් ක්‍රීඩා උළෙල | ප්‍රථම ස්ථානය |
| | | දුර පැනීම | දකුණු පළාත් පාසල් ක්‍රීඩා උළෙල | ප්‍රථම ස්ථානය |
| 05. | ඩී.ජී. විශාල් ආලෝක විජේවික්‍රම | මිශ්‍ර සහය දිවීම | සමස්ථ ලංකා පාසල් සහය දිවීම | තෙවන ස්ථානය |
| 06. | එච්.ජී. ස්නේහා බ්‍රයිට් මේරි | මිශ්‍ර සහය දිවීම | සමස්ථ ලංකා පාසල් සහය දිවීම | තෙවන ස්ථානය |
| 07. | ඩබ්.ජී. සසිඳු හංසක | දුර පැනීම | සමස්ථ ලංකා පාසල් තරඟ | දෙවන ස්ථානය |
| | | දුර පැනීම | සර් ජෝන් ටාබට් කණිෂ්ඨ මලල ක්‍රීඩා ශූරතාවලිය | ප්‍රථම ස්ථානය |

### 2.1.5. 2025 වර්ෂයේ සංඛ්‍යා ලේඛන අංශය සිදු කල සුවිශේෂී කාර්යයන් හා ලද ජයග්‍රහණ

- 2015 වර්ෂයට අදාළව ශ්‍රම බල සමීක්ෂණ 112 සිදුකිරීමෙන් ප්‍රධාන කාර්යාලය ලබාදුන් සමීක්ෂණ පැවරුම් සම්පූර්ණ කිරීම.
- සෑම ප්‍රා.ලේ කොට්ඨාශයකටම අදාළව ප්‍රධාන කාර්යාලයෙන් ලබා දුන් නියැදී අනුව වාර්ෂික කර්මාන්ත සමීක්ෂණ 111, පොල් නිෂ්පාදන කර්මාන්ත පරීක්ෂණ 09 හා ඉදිකිරීම් කර්මාන්ත සමීක්ෂණ 31 ක් සිදුකිරීම.
- 2004/25 වගා වර්ෂයට අදාළව ප්‍රා.ලේ කොට්ඨාශ මට්ටමින් යල සහ මහ කන්නවලට අනුව ගොඩ ගොවිතැන් සංඛ්‍යා ලේඛන රැස්කිරීම.
- 2024/25 වගා වර්ෂයට අදාළව යළ කන්නයේ වී අස්වනු සමීක්ෂණය 179 සහ මහකන්නයේ සමීක්ෂණ 85ක් සිදු කිරීම.
- සියලු පළාත් පාලන ආයතන වලට අදාළව පළාත් පාලන සංඛ්‍යා ලේඛන වාර්තා ලබා ගැනීම 2025 මැයි 31 වන දිනට පෙර අවසන් කිරීම.
- ආර්ථික සංගනනයේ කෘෂිකාර්මික කටයුතු ගණන් ගැනීමට අදාලව නිලධාරීන් 896 දෙනෙකු පුහුණු කිරීම.

### 2.1.6. 2025 වර්ෂයේ පාරිභෝගික කටයුතු පිලිබඳ අධිකාරිය (මාතර කාර්යාලය) සිදු කල සුවිශේෂී කාර්යයන් හා ලද ජයග්‍රහණ

| ජයග්‍රහණය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | වෙනත් කරුණු |
|---|---|---|
| වැටලීම් 858 | දඩ මුදල - රු. 11,459,000.00 | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 ආවරණය වන පරිදි වැටලීම් සිදු කර ඇත. |
| දැනුවත්කිරීම් වැඩසටහන් 39 ක් සිදු කිරීම | පාසල් සිසුන් 331, පාරිභෝගිකයින් 1315, වෙළඳුන් 593 | පාසල් සිසුන්, කාර්මික විද්‍යාල සිසුන්, පාරිභෝගිකයින් හා වෙළඳුන් ආවරණය වන පරිදි වැටලීම් සිදු කර ඇත. |
| පාරිභෝගික සහන පැමිණිලි 45 ක් විමර්ශනය කිරීම | 41 | පැමිණිලි 41 ක පාරිභෝගිකයින් හට සහන ලබා දී ඇත. |
| මිල සමීක්ෂණයන් 288 ක් සිදු කිරීම | | සතියකට දින 03 බැගින් සෑම මාසයකම මිල සමීක්ෂණයන් සිදු කිරීම. |

### 2.1.7. 2025 වර්ෂයේ ඉංජිනේරු අංශය සිදු කල සුවිශේෂී කාර්යයන් හා ලද ජයග්‍රහණ

- පියදාස රත්නායක සිල්මාතා ආරාමයේ II පියවර අවසන් කර III පියවරේ වැඩ කටයුතු ආරම්භ කිරීම.
- පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නව පස් මහල් ගොඩනැගිල්ල ඉදිකිරීම් 111 අදියර වැඩ අවසන් කිරීම හා IV වන අදියරේ වැඩ ආරම්භ කිරීම.
- වතු ප්‍රදේශ වල ආපදා නිවාස වැඩසටහන - 2025 එන්සාල් වත්ත හා දෙනියාය ප්‍රදේශයන්හි සිදු කිරීම.

### 2.1.8. ආයතන හා ඉඩම් අංශ යටතේ සිදු කල සුවිශේෂී කාර්යයන් හා ලද ජයග්‍රහණ

- **CLEAN SRILANKA ජාතික ව්‍යාපාරය යටතේ සිදු කල වැඩසටහන්**

Clean Sri Lanka වැඩහටහන යටතේ විවිධ වැඩසටහන් 2025 වර්ෂය තුල ක්‍රියාත්මක විය. ඒ යටතේ Save Nilawala වැඩසටහන, ක්ලීන් ශ්‍රී ලංකා ජංගම සේවා සහ විශේෂ ජන සත්කාර වැඩසටහන, සහ වෙරල පිරිසිදුකිරමේ වැඩසටහන්, තිරල කැලේ ඇකේෂියා ඉවත්කිරීම වැනි වැඩසටහන් මේ යටතේ ක්‍රියාත්මක කර ඇත.

- **SAVE NILWALAA වැඩසටහන**

නිල්වලා ගඟ පිරිසිදුකිරීමේ ව්‍යාපෘතිය යටතේ 2025.03.13 දින අකුරැස්ස පාලම අසළින් ආරම්භ කරන ලද නිල්වලා ගඟේ බාධක ඉවත්කර නිල්වලා ගඟ පිරිසිදුකිරීමේ වැඩකටයුතු දිස්ත්‍රික් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නිලධාරීන්ගේ හා 613 බලසේනා මූලස්ථානයේ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් ඉතා සාර්ථක ලෙස සිදුකරන ලදී.




- **" සතුටු රටක් ගමින් ගමට" ක්ලීන් ශ්‍රී ලංකා ජංගම සේවා සහ විශේෂ ජන සත්කාර වැඩසටහන -මාතර දිස්ත්‍රික්කය**

මෙම වැඩසටහන සඳහා මාතර දිස්ත්‍රික්කය තුල විවිධ අංශ නියෝජනය කරමින් රාජ්‍ය ආයතන විශාල ප්‍රමාණයක් සහභාගී වූ අතර දිස්ත්‍රික්කයේ පදිංචි ජනතාව වෙනුවෙන් බැංකු, ප්‍රවාහන, සෞඛ්‍ය, ආයුර්වේද, කෘෂිකාර්මික, කුඩා ව්‍යාපාර ආදී විවධ අංශයන්ගෙන් යුත් ජංගම සේවා සැපයීම සිදු කරන ලදී.

| ලබාදුන් මුළු ප්‍රතිපාදන මුදල | කාර්යාලය | සිදුකරන ලද වැඩසටහන් ගණන | භෞතික ප්‍රගතිය | මුළු වියදම |
|---|---|---|---|---|
| රු. මිලියන 3.6 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය / හා ප්‍රා .ලේ කොට්ඨාස | 22 | 100% | රු.මිලියන 2.46 |




දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්හි ජංගම සේවා හා විශේෂ ජනසත්කාරක වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

- **කිරල කැලේ ආක්‍රමණික ඇකේෂියා සහ වෙල් ආතා ශාක ඉවත්කිරීම හා කිරල කැලේ රක්ෂිතය සංවර්ධනය කිරීමේ වැඩසටහන**

මේ යටතේ කිරල කැලේ රාජ්‍ය නිලධාරීන් 150 ගේ හා ප්‍රදේශයේ මහජනතාවගේ, දේශපාලන අධිකාරියේ දායකත්වයෙන් 2025.10.11 දින මෙම වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කරනු ලැබීය.

- **අස්වැසුම ප්‍රතිලාභ ගෙවීමේ වැඩසටහන**

සුභ සාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් සිදු කරනු ලබන අස්වැසුම ප්‍රතිලාභ ගෙවීමේ වැඩසටහන 2025 වර්ෂය තුල මාතර දිස්ත්‍රික්කයේ අදියර 02 ක් යටතේ ක්‍රියාත්මක වූ බවත්, එහි පළමු අදියර සඳහා ප්‍රතිලාභීන් ප්‍රධාන බාණ්ඩ 4 ක් (අන්ත දුගී, දුගී, අවධානම් සහගත හා සංක්‍රාන්ති) යටතේ සලකා බලන ලද අතර, දෙවැනි අදියර සඳහා ප්‍රධාන බාණ්ඩ 3 ක්(අන්ත දුගී, දුගී, අවධානම් සහගත) යටතේ සලකා බලන ලද අතර එසේ අස්වැසුම ප්‍රතිලාභ ලද ප්‍රතිලාභීන් සංඛ්‍යාව පහත දැක්වේ.

| අදියර | අන්ත දුගී | දුගී | අවධානම් සහගත | සංක්‍රාන්ති |
|---|---|---|---|---|
| පළමු අදියර | 11,141 | 23,013 | 13,541 | 13,947 |
| දෙවැනි අදියර | 2,261 | 4,101 | 2,143 | - |

- **ගැබිණි මව්වරුන් සඳහා පෝෂණ වැඩසටහන්**

2025 වර්ෂයේ පෝෂණ වැඩසටහන යටතේ ගැබිණි මව්වරුන් 10,837 ක් සඳහා පෝෂණ දීමනා ලබාදීම. මේ සඳහා වියදම් කල මුදල රු. මිලියන 300.6 කි.

- **අභ්‍යන්තර කටයුතු ඒකකයක් පිහිටුවීම**

2025 වර්ෂයේ මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය තුල අභ්‍යන්තර කටයුතු ඒකකයක් පිහිටුවීම සිදු කරන ලදී. මේ යටතේ අප ආයතනයේ සේවය සැපයීම සම්බන්ධයෙන් වන විමසීම් හා පැමිණිලි වාර්තා කිරීම සඳහා සේවා ලාභීන්ට අවස්ථාව සලසා දී ඇති අතර මෙහි සම්බන්ධීකරණ නිලධාරියා ලෙස මාතර අතිරේක දිස්ත්‍රික් ලේකම් කුසලක නානායක්කාර මහතා කටයුතු කරයි. මෙම අංශය මගින් ආචාර ධර්ම පද්ධතියක් නිලධාරීන් වෙත හඳුන්වාදීම ද මෙම වර්ෂයේදී සිදුකරන ලදී.

- **Gov Ems දත්ත පද්ධතිය පිහිටුවීම**

262 වැය ශීර්ෂය යටතේ වැටුප් ලබන දිස්ත්‍රික්කයේ සියලුම නිලධාරීන්ගේ තොරතුරු ඇතුලත් කර Gov Ems දත්ත පද්ධතිය සකස් කිරීම සිදු කරන ලදී. මේ යටතේ නිලධාරීන්ගෙන් 70% ක් පමණ තොරතුරු මෙම දත්ත පද්ධතියට ඇතුලත් කර ඇත.

- **ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරීක්ෂණය සිදු කිරීම**

2025 වර්ෂයේ මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක් පරික්ෂා කිරීම සිදු කරන ලදී. ඒ යටතේ 2025.07.30 දින වැලිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයද, 2025.11.07 දින දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයද පරික්ෂා කිරීම සිදු කරන ලදී. මේ තුලින් මහජනතාවට වඩාත් ඵලදායි සේවාවක් ලබාදීමට අවශ්‍ය වැඩ පරිසරය නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය මගපෙන්වීම ලබාදෙන ලදී.

- **ග්‍රාම නිලධාරී කාර්යාල පරික්ෂා කිරීම**

2025 වර්ෂයේ මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් ග්‍රාම නිළධාරී කාර්යාල 164 ක් පරික්ෂා කිරීම සිදු කල අතර එහිදී එම කාර්යාලවල ගුණාත්මකභාවය වර්ධනය කිරීම සඳහා අවශ්‍ය උපදෙස් හා මගපෙන්වීම ලබාදෙන ලදී.

## 2.1.10. කුඩා ව්‍යාපාර අංශය සිදු කල සුවිශේෂී කාර්යයන් හා ලද ජයග්‍රහණ

2025 වර්ෂයේ කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යංශයේ මාතර කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය මගින් ක්‍රියාත්මක කළ වැඩසටහන යටතේ දිස්ත්‍රික්කය පුරා ව්‍යවසායකයින් 260 ක් තෝරා ඔවුන් තුලින් අපනයන අභිමුක ව්‍යවසායකයින් 35 දෙනෙකු තවදුරටත් සංවර්ධනය සඳහා අවශ්‍ය මග පෙන්වීම සිදු කරන ලදී.

මාතර දිස්ත්‍රික් කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ කාර්ය සාධනය පහත පරිදි දැක්විය හැකිය.

| කාර්ය සාධන දර්ශකය | ඉලක්කය | ප්‍රගතිය | % |
|---|---|---|---|
| ව්‍යාපාර සංවර්ධනය( only Business level up) | 260 | 243 | 93% |
| අලෙවි සබඳතා ගොඩ නැංවීම | 288 | 839 | 291% |
| තනි පුද්ගල තාක්ෂණ ලබා දීම | 242 | 345 | 143% |
| ව්‍යාපාර සැලසුම් සැකසීම | 330 | 385 | 117% |
| පිරිවැයකරණය | 400 | 746 | 187% |
| ඇසුරුම්කරණය | 163 | 304 | 187% |
| ලෝගෝ( logo) | 128 | 215 | 168% |

## 2.1.11 දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකකය - මාතර

- රාජ්‍ය නිළධාරීන් සඳහා ආපදා කළමනාකරණය සහ ගිණි නිවාරණය පිළිබඳව දැනුවත් කිරීම හා පුහුණු කිරීම.
- නිරිත දිග මෝසම සබැඳිව දිස්ත්‍රික් ආපදා කළමනාකරණ කමිටුව දැනුවත් කිරීම.
- හදිසි ගංවතුර අවස්ථාවකදී ක්‍රියා කලයුතු ආකාරය පිළිබඳව පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ තරුණ ප්‍රජාව හා පෙර පාසල් ගුරුවරුන් පුහුණු කිරීම.
- ආපදා කළමනාකරණය හා ප්‍රථමාධාර පිළිබඳව පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තෝරාගත් ග්‍රාම නිලධාරී වසම්හි තරුණ ප්‍රජාව දැනුවත් කිරීම හා පුහුණු කිරීම.
- ග්‍රාමීය මට්ටමින් ගංවතුර පෙරහුරු සරඹ ක්‍රියාත්මක කරමින් ප්‍රජාව දැනුවත් කිරීම.
- පාසල් ආරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම -මාකඳුර මහා විද්‍යාලය.

### 2.1.12 දිස්ත්‍රික් වගවීම ඒකකය

- CITIZEN MIRROR ප්‍රාදේශීය වගවීම දර්ශකය යටතේ දිවයිනේ සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි දත්ත ඇතුලත් කිරීමේ වැඩසටහන යටතේ මාතර දිස්ත්‍රික්කයේ ද සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල දත්ත ද ඇතුලත් කරන ලද අතර 83% ක ප්‍රගතියක් හිමි කරගෙන තිබුණි.
- CLEAN SRI LANKA වැඩසටහනට සමගාමීව පැවැත්වෙන ජාතික වගවීම සම්මාන තරඟාවලිය 2025/26 වර්ෂය සඳහා මාතර දිස්ත්‍රික්කය තුල ආයතන 220 ක් ලියාපදිංචි කිරීම.
- " දැය නංවන සපිරි ගමක් ප්‍රජා වගවීම ආදර්ශ ගම්මාන ව්‍යාපෘතිය 2025/2027" යටතේ සෑම ප්‍රා.ලේ. කොට්ඨාශයකම තොරාගත් ග්‍රාම නිලධාරී වසමක ගෘහ ඒකක 50 ක් වගවීමකින් සවිබල ගැන්වීම යටතේ 2025 වර්ෂය තුල ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු අනුමැතියෙන් ගම්මාන 16 ක් තෝරාගෙන අදාල දැනුවත් කිරීම් සිදු කිරීම.

## 2.1.13. ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ලබාගත් ජයග්‍රහණ

- 2025 වර්ෂය තුල ක්‍රියාත්මක Divisional Digitalization Project වැඩසටහන යටතේ තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ජයග්‍රහණය ලබා ගැනීම.
- 2025 සමස්ථ ලංකා ප්‍රතිභා නර්තන තරඟවලින් ප්‍රථම ස්ථානයද, මාතර දිස්ත්‍රික් සාහිත්‍ය තරගාවලිය, 2025 රාජ්‍ය ළමා චිත්‍ර උළෙල, මාතර දිස්ත්‍රික් මළල ක්‍රීඩා තරගාවලිය, රාජ්‍ය සේවක නිර්මාණ සම්මාන උළෙල තුලින් ජයග්‍රහණ ලබා ගැනීම.
- සමෘද්ධි සමාජ සංවර්ධන වැඩසටහන යටතේ 2025 දුම්වැටි හා මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහනේ මුදල් ඒකරාශී කිරීම තුළ දිස්ත්‍රික් ප්‍රථම ස්ථානය අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ලබා ගැනීම.
- සමෘද්ධි බැංකු ලාභදායකත්වය තුළ දිස්ත්‍රික් බැංකු 50 ක් අතර අකුරැස්ස සමෘද්ධි බැංකුව ප්‍රථම ස්ථානය ලබා ගැනීම හා 2025 බැංකු සමිති ලාභ දායකත්වය තුළ දිස්ත්‍රික් තෙවැනි ස්ථානය අකුරැස්ස ප්‍රජා මූල බැංකු සමිතිය දිනා ගැනීම.

- ESPD ව්‍යාපෘතිය යටතේ JICA ආයතනය හා එක්ව සිදු කල රැකියාගත කිරීම් යටතේ මාතර දිස්ත්‍රික්කය ප්‍රථම ස්ථානය කොටපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ලබාගැනීම.
- වැලිපිටිය ප්‍රදේශීය ලේකම් කාර්යාලය විසින් අන්තර් සංස්කෘතික මධ්‍යස්ථාන ප්‍රතිභා ජාතික තරඟාවලිය-2025 සමස්ථ ලංකා ශුරතාවය ලබාගැනිම.

## 2.2 ඉදිරි ඉලක්ක

### 2.2.1 2026 වර්ෂයේදී කෘෂිකර්ම අංශය මගින්,

දිස්ත්‍රික්කයේ ආහාර සුරක්ෂිතතාවය ඉහළ නැංවීම සඳහා පහත සඳහන් ව්‍යාපෘති යෝජනා කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම.

| අනු අංකය | ව්‍යාපෘතිය | රජයේ දායකත්වය (රු.) | ප්‍රතිලාභී දායකත්වය (රු.) | මුළු පිරිවැය (රු.) |
|---|---|---|---|---|
| 1 | ඇපල් පේර වගාව ව්‍යාප්ත කිරීම තුලින් දිස්ත්‍රික්කයේ පලතුරු නිෂ්පාදනය ඉහළ නැංවීම. | 652,196.00 | 1,072,800.00 | 1,724,996.00 |
| 2 | බිම්මල් වගාව සඳහා යාන්ත්‍රිකරණය හඳුන්වා දීම තුළින් නිෂ්පාදන ධාරිතාවය හා ඵලදායිතාවය ඉහළ නැංවීම | 756,123.00 | 930,500.00 | 1,686,623.00 |
| 3 | වී වගාව සඳහා යාන්ත්‍රිකරණය හඳුන්වාදීම මඟින් නිෂ්පාදන ඵලදායිතාවය ඉහළ නැංවීම. | 1,337,352.00 | 1,326,530.00 | 2,663,882.00 |
| 4 | හම්බන් පුවක් වගාව ප්‍රචලිත කිරීම තුලින් කෘෂිකාර්මික ව්‍යවසායකත්වය ඉහල නැංවීම | 515,000.00 | 2,100,000.00 | 2,615,000.00 |
| 5 | දේශීය වැල් අල බෝග වගාව සංවර්ධනය කිරීම මඟින් කොට්ඨාසයේ ආහාර සුරක්ෂිතතාවය ඉහළ නැංවීම | 675,680.00 | 716,400.00 | 1,392,080.00 |
| 6 | යාන්ත්‍රිකරණය භාවිතාය දිරිගැන්වීම තුළින් කඹුරුපිටිය කොට්ඨාසයේ වී නිෂ්පාදන ඵලදායීතාවය ඉහළ නැංවීම | 554,449.00 | 940,000.00 | 1,494,449.00 |
| | මුළු එකතුව | **4,490,800.00** | **7,086,230.00** | **11,577,030.00** |

### 2.2.2. 2026 වර්ෂයේදී ක්‍රීඩා අංශය මගින්,

- 2026 වසරේදීත් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් සංවිධානය කරනු ලබන ජාතික මහා ක්‍රීඩා උලෙලට සමගාමීව පැවැත්වෙන තරඟාවලීන් සඳහා උපරිම සහය දැක්වීම.
- ක්‍රීඩක ක්‍රීඩිකාවන් පුහුණුකරවීම හා ජාතික හා ජාත්‍යන්තර තලයේ ජයග්‍රහණ ලබා ගැනිමට ක්‍රීඩක ක්‍රීඩිකාවන් යොමු කර වීම.

### 2.2.3. 2026 වර්ෂයේදී ඉංජිනේරු අංශය මගින්,

| ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන වැඩසටහන | ඇස්තමේන්තුගත මුදල |
|---|---|
| වතු ප්‍රදේශ වල ආපදා නිවාස වැඩසටහන - 2025 එන්සාල් වත්ත | 56,402,531.66 |
| වතු ප්‍රදේශ වල ආපදා නිවාස වැඩසටහන - 2025 දෙනියාය වත්ත | 7,989,854.82 |
| පරදුපල්ල පොල්ගහ කන්ද මාර්ගයේ බෝක්කුව ඉදි කිරීම් කටයුතු අවසන් කිරීම | 5,489,757.29 |
| පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නව පහල් ගොඩනැගිල්ල IV වන අදියරේ වැඩ අවසන් කිරීම | 91,400,000.00 |
| බොරාල සමෘද්ධි බැංකුව පළමු මහළ ඉදි කිරීම | 15,430,888.52 |

| | |
|---|---|
| දික්වැල්ල දංදෙණිය සමෘද්ධි බැංකුව පහළ මහළ ඉදි කිරීම | 15,130,449.76 |
| යටියන සමාද්ධි බැංකුව ඉදි කිරීම | 15,561,984.44 |
| පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නව පස්මහල් ගොඩනැගිල්ල ඉදි කිරීමේ ඉතිරි වැඩ | - |
| කෘෂි අංශය අලුත්වැඩියාව | 500,000 |
| ආපන ශාලාව අලුත්වැඩියා කටයුතු | 1,000,000 |
| නිල නිවාස අලුත්වැඩියාව | 2,600,000 |

### 2.2.4. 2026 වර්ෂයේදී සංඛ්‍යාලේඛන අංශය මගින්,

- 2026 වර්ෂයේදී සෑම මසකම දෙවැනි සතියේදී තෝරාගත් මිල මධ්‍යස්ථාන තුනක් ඇසුරින් සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම නිෂ්පාදකයාගේ මිල රැස්කිරීම.
- 2026 වර්ෂයට අදාලව සෑම පළාත් පාලන ආයතනයකින්ම මාසිකව ගොඩනැගිලි සංඛ්‍යා ලේඛන රැස්කිරීම.
- වාර්ෂික කර්මාන්ත සමීක්ෂණය සිදු කිරීම.
- වාර්ෂික ඉදිකිරීම් කර්මාන්ත සමීක්ෂණය, වාර්ෂික පොල් නිෂ්පාදන කර්මාන්ත සමීක්ෂණය සිදු කිරීම.
- 2025/2026 වර්ෂයට අදාලව ප්‍රා.ලේ. කොට්ඨාශ මට්ටමින් යළ සහ මහ කන්න වලට අනුව ගොඩ ගොවිතැන් සංඛ්‍යා ලේඛන රැස් කිරීම.
- 2026 වර්ෂයේ යල හා මහ කන්න වලට අදාලව වී අස්වනු සමීක්ෂණය සිදු කිරීම.
- 2025 වර්ෂයට අදාලව සියලු පළාත් පාලන ආයතන වලින් පළාත් පාලන සංඛ්‍යාලේකන වාර්තා ලබා ගැනීම.
- 2026 වර්ෂයට අදාලව ප්‍රා. ලේ. කොට්ඨාශමට්ටමින් කාර්තුමය වශයෙන් ගෘහස්ත හා ආයතනික දැව කපා හෙලීම් පිලිබඳ සංඛ්‍යා ලේඛන වාර්තා ලබාගැනීම.

### 2.2.5. 2026 වර්ෂයේදී ක්‍රම සම්පාදන අංශය මගින්,

1. 2026 වර්ෂයට අදාලව විමධ්‍යගත අයවැය වැඩසටහන අඛණ්ඩව ඉදිරියට ක්‍රියාත්මක කිරීම.
2. 2026 වර්ෂයේ සිට ප්‍රජා ශක්ති ජාතික ව්‍යාපාරයට සමගාමීව ග්‍රාමීය මට්ටමෙන් සංවර්ධන ව්‍යාපෘති හඳුනාගැනීම හා ක්‍රියාත්මක කිරීම තුලින් බහුමාන දරිද්‍රතාවය පිටු දැකීමට හා ග්‍රාමීය ජන ජීවිතය ඉහළ නැංවීම සඳහා දායක වීම.
3. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු හා සැලසුම් කමිටුව පැවැත්වීම තුලින් රජයේ සංවර්ධන ක්‍රියාවලිය කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණය සිදුකිරීම.
4. අධ්‍යාපන, ධීවර, සංචාරක, සෞඛ්‍ය, ප්‍රවාහන හා මහා මාර්ග වැනි අනු කමිටු පවත්වා ඒ ඒ විෂය ක්ෂේත්‍රයන් හි ප්‍රගතිය අධීක්ෂණය සිදු කිරීම හා අදාළ අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
5. රටම එකට ජාතික මෙහෙයුම් වැඩසටහන යටතේ දිස්ත්‍රික් සභා සහ ප්‍රාදේශීය සභා ස්ථාපිත කිරීම.
6. විෂ මත්ද්‍රව්‍ය වැලැක්වීමේ ජාතික ව්‍යාපාරය යටතේ සිදු කල යුතු වැඩසටහන් සිදු කිරීම.
7. ග්‍රාමීය මාර්ග වැඩසටහන සිදු කිරීම.
8. දිස්ත්‍රික් සම්පත් පැතිකඩ යාවත්කාලින කිරීම.
9. අනෙකුත් සංවර්ධන ව්‍යාපෘති ඉටු කිරීම.

**2.2.6. 2026 වර්ෂයේ දී ආයතන/ඉඩම් අංශය මගින්**

1. Clean Sri Lanka වැඩසටහන යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 16 ආවරණය වන පරිදි ග්‍රාමීය සංවර්ධනය ඉහල නැංවීම සඳහා සමාජයීය, පාරිසරික හා සදාචාරාත්මක කුළුණු ආවරණය වන පරිදි එක් එක් ප්‍රදේශයට ආවේණික සම්පත් හඳුනාගනිමින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
2. කිරල කැලේ රක්ෂිතය සංවර්ධනය කර එය සංචාරක ආකර්ශනය සහිත කලාපයක් බවට පත් කිරීම සඳහා වන වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම.
3. මාතර දිස්ත්‍රික්කයේ කසල කළමනාකරණය සඳහා යෝජිත වාලි මවුන්ට් වත්ත කසල කළමනාකරණ ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු සිදු කිරීම.
4. Gov Ems දත්ත පද්ධතිය යටතේ 262 වැය ශීර්ෂය යටතේ වැටුප් ලබන මාතර දිස්ත්‍රික් සියලු රාජ්‍ය නිලධාරීන්ගේ තොරතුරු ඇතුලත් කිරීම.
5. සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා ග්‍රාම නිලධාරී කාර්යාල පරීක්ෂණය සිදු කර අවසන් කිරීම.

ඕ. වී. චන්දන තිලකරත්න
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
මාතර

## 03. පරිච්ඡේදය - 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

### 3.1. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

| සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2025 රු. | | සටහන | තත්‍ය 2025 රු. | තත්‍ය 2024 රු. | |
|---|---|---|---|---|---|
| - | **ආදායම් ලැබීම්** | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | ඒසීඒ-1 |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | ඒසීඒ-1 |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | - | - | |
| - | **ආදායම් නොවන ලැබීම්** | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 6,438,121,000 | 6,774,582,000 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 667,075,415 | 1,377,177,088 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 139,914,886 | 131,913,480 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **7,245,111,301** | 8,283,672,568 | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **7,245,111,301** | 8,283,672,568 | |
| | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)** | | 97,728,233 | 118,000,000 | |
| | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)** | | 7,147,383,068 | 8,165,672,568 | |
| | **අඩු කළා : වියදම්** | | | | |
| - | **පුනරාවර්තන වියදම්** | | - | | |
| 2,538,244,300 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 2,527,872,890 | 2,105,116,455 | ඒසීඒ-2(ii) |
| 263,365,700 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 253,515,431 | 221,885,332 | ඒසීඒ-2(ii) |
| 15,350,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 14,997,072 | 490,942,637 | ඒසීඒ-2(ii) |
| - | පොළී ගෙවීම් | 8 | - | - | ඒසීඒ-2(ii) |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | - | ඒසීඒ-2(ii) |
| **2,816,960,000** | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **2,796,385,393** | 2,817,944,424 | |
| | **මූලධන වියදම්** | | | | |
| 195,000,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 10 | 173,603,858 | 59,904,708 | ඒසීඒ-2(ii) |
| 274,000,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 108,199,387 | 78,482,444 | ඒසීඒ-2(ii) |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | - | - | ඒසීඒ-2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | ඒසීඒ-2(ii) |
| 4,000,000 | හැකියා වර්ධනය | 14 | 3,724,173 | 1,619,851 | ඒසීඒ-2(ii) |
| 76,000,000 | වෙනත් මූලධන වියදම් | 15 | 72,154,737 | - | ඒසීඒ-2(ii) |
| **549,000,000** | **මුළු මූලධන වියදම් (උ)** | | **357,682,155** | 140,007,004 | |
| | තැන්පතු ගෙවීම් | | 688,372,500 | 1,252,954,249 | ඒසීඒ-4 |
| | අත්තිකාරම් ගෙවීම් | | 150,102,284 | 229,358,212 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)** | | 838,474,784 | 1,482,312,461 | |
| | **මුළු වියදම් එ = (ඊ+උ+ඌ)** | | 3,992,542,333 | 4,440,263,889 | |
| - | **දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)** | | 3,154,840,735 | 3,725,408,679 | |
| | **අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය** | | 3,154,840,735 | 3,725,408,679 | ඒසීඒ-7 |
| | **දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය** | | - | - | ඒසීඒ-3 |

1

## 3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

**2025 දෙසැම්බර් 31 දිනට**

**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය**

| | සටහන | තත්‍ය 2025 රු. | 2024 රු. |
|---|---|---|---|
| <u>**මූල්‍ය නොවන වත්කම්**</u> | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 3,233,050,253 | 3,023,150,066 |
| <u>**මූල්‍ය වත්කම්**</u> | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 355,106,279 | 344,918,881 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | - |
| **මුළු වත්කම්** | | **3,588,156,532** | **3,368,068,947** |
| <u>**ශුද්ධ වත්කම් / ස්කන්ධය**</u> | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | 52,900,927 | 21,416,444 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 3,233,050,253 | 3,023,150,066 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | **ඒසීඒ-5(බී)** | | |
| <u>**ජංගම වගකීම්**</u> | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 302,205,352 | 323,502,437 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | - | - |
| **මුළු වගකීම්** | | **3,588,156,532** | **3,368,068,947** |

පිටු අංක 01.සිට 66 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 67. සිට 134 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. **මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 විධිවිධානයන්ට අනුකූලව** සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

| 14.1. | සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම. | අනුකූල වේ | | |
| 14.2. | මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම,එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම. | අනුකූල වේ | | |
| 14.3. | මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදී තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම. | අනුකූල වේ | | |
| 14.4. | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම. | අනුකූල වේ | | |
| 15 | ආදායම් ගිණුම | | | |
| 15.1. | අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම. | අනුකූල වේ | | |
| 15.2. | රැස් කර තිබූ ආදායම්,තැන්පත් ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම. | අනුකූල වේ | | |
| 15.3. | මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 16 | මානව සම්පත් කළමනාකරණය | | | |
| 16.1. | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම. | අනුකූල නොවේ | රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් මත උපාධිධාරී අභ්‍යාසලාභීන් ලෙස බඳවා ගත් නිලධාරීන්ට පත්වීම් ලබා දීම | අතිරික්ත සේවක සංඛ්‍යාව සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගැනිමට කටයුතු කිරීම |
| 16.2. | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම. | | | |
| 16.3. | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 17 | මහජනයා වෙත තොරතුරු ලබා දීම | | | |
| 17.1. | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 17.2. | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර,වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම. | අනුකූල වේ | | |
| 17.3. | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 18 | පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම | | | |
| 18.1. | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම. | අනුකූල වේ | | |
| 18.2. | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි,පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම. | අනුකූල වේ | | |
| 19 | මානව සම්පත් සැලැස්ම සම්පාදන කිරීම | | | |
| 19.1. | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම. | අනුකූල වේ | | |
| 19.2. | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම. | අනුකූල වේ | | |
| 19.3. | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්යමණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම. | අනුකූල වේ | | |
| 19.4. | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම,නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම. | අනුකූල වේ | | |
| 20 | විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම | | | |
| 20.1. | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම. | අනුකූල වේ | | |

# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE


මගේ අංකය / எனது இல. / My No. } SPCG/MT/A/DSFS/02/25/20 ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2026 මැයි 27 දින

ගණන්දීමේ නිලධාරී

මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**ශීර්ෂය 262 - මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය 262 - මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මාතර දිස්ත්‍රික් ලේකම් කර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2025 අංක 19 දරන ජාතික විගණන (සංශෝධන) පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව ඉදිරියේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන විගණනයට අදළව සිදුකල සෝදිසි විගණන පරීක්ෂාවේදි පහත කරුණු නිරික්ෂණය විය.

### 1.6.1 මූල්‍ය නොවන වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂයේ රජයේ වාහන 56 ක් සඳහා පූර්ණ රක්ෂණ ආවරණය ලබාගැනීමේ දී තක්සේරු කර තිබුණු වෙළඳපොල වටිනාකම රු.275,150,000 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන තුළ රු.236,636,505 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා වාහනවල වටිනාකම රු.38,513,495 ක් අඩුවෙන් දැක්වුණි.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා තවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක් විසින් ඉකුත් වර්ෂවලදී මිලදීගෙන වෙනත් බාහිර ආයතනවල පරිහරණය සඳහා නිකුත් කර තිබුණු පිරිවැය එකතුව රු.5,469,000 ක්වූ ප්‍රවාහන උපාංග, ජංගම නොවන වත්කම් ලෙස ගිණුම්ගත කිරීම නිසා ජංගම නොවන වත්කම් සමාන වටිනාකමින් වැඩියෙන් දැක්වුණි.

(ඇ) භාණ්ඩාගාර ලේකම්ගේ අංක 01/2017 දරන හා 2017 ජුනි 28 දිනැති චක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාරව රාජ්‍ය ආයතන සතු වත්කම් ඒ ඒ ආයතනවල ලේඛනගත කර ඇති නමුත් ඒවා පිළිබඳ මධ්‍යගත ලේඛනයක් පවත්වා නොතිබුණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා තවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක 2025 දෙසැම්බර් 31 දිනට ඉඩම් හා ගොඩනැගිලි, වෙනත් යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණවලට අදාළ

සිගාස් වාර්තාවේ පිරිවැය හා කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත ඉදිරිපත් කර තිබුණු වාර්තාවේ පිරිවැය අතර රු.34,726,713 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඈ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සැලසුම් අංශය විසින් පරිහරණය කරනු ලබන වෙළඳපොල වටිනාකම රු.3,000,000 ක්වූ ටොයෝටා කැබ් රථය ජංගම නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණු බැවින් ජංගම නොවන වත්කම් සමාන අගයකින් අඩුවෙන් දැක්වුණි.

(ඉ) 2025 දෙසැම්බර් 17 දිනැති හා අංක 02/2025 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 8.2 වගන්තිය ප්‍රකාරව, මූල්‍ය නොවන වත්කම් තිබේ නම් ඒවා නිසි පරිදි හඳුනාගෙන පිරිවැයට හෝ පිරිවැය හඳුනාගත නොහැකි අවස්ථාවලදී තක්සේරුකළ අගයට හෝ ගිණුම්ගත කළයුතු වුවත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 කට අයත් භූමි ප්‍රමාණය හෙක්ටයාර් 12.8221 ක් වූ ඉඩම් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 කට අයත් වර්ග මීටර් 2561.79 කට අධික ගොඩනැගිලි සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

### 1.6.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

මුදල් රෙගුලාසි 1647(ඉ) ප්‍රකාරව, වාහනභාර නිලධාරී විසින් තමා භාරයේ ඇති මෝටර් වාහන පිළිබඳව ඒ ඒ වාහනයේ වර්ගය හා මෝස්තරය ද ලියාපදිංචි කිරීමේ අංකය ද, තමන්ට භාරදුන් දිනය ද පැවරූ දිනය හා ගෙවූ මුදල, ගෙවූ දිනය, රක්ෂණ සමාගමේ නම සහ රක්ෂණ සමාගමේ අංකය ආදී විස්තර ද වෙනත් තොරතුරු ද දැක්වෙන ලැයිස්තුවක් තබාගත යුතු වුවත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා දික්වැල්ල, මාතර කඩවත්සතර, අතුරලිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල සතු රජයේ වාහන සම්බන්ධයෙන් ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි.

## 2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පුනරාවර්තන වැය විෂයයන් 06 කට අදාලව මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 5.91 සිට සියයට 48.33 දක්වා පරාසයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

(ආ) මූලධන වැය විෂයය 06 කට අදාළව මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 5.06 ක සිට සියයට 82.83 ක පරාසයක ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් තොරව ඉතිරි වී තිබුණි.

(ඇ) වැය විෂයයන් 09 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය ප්‍රමාණවත් නොවීම නිසා වෙනත් වැය විෂයයන් 19 කින් සියයට 1.4 සිට 44.11 දක්වා පරාසයකින් ප්‍රතිපාදන මාරුකර වියදම් දරා තිබුණි.

(ඈ) වැය විෂයයන් 19 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම නිසා එම ප්‍රතිපාදනයන්ගෙන් සියයට 1.93 සිට සියයට 98 දක්වා පරාසයකින් ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන්ට මාරුකර තිබුණි.

(ඉ) 1950 අංක 09 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38(අ) අතුරු විධානය යටතේ දෙවිනුවර, දික්වැල්ල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශවල ගම් පුළුල් කිරීම සඳහා පිළිවෙලින් ඉඩම් කැබලි 84 ක් හා 11 ක් අත්පත් කර ගැනීමේදී රු.45,398,760 ක්, රු.25,084,114 ක් වශයෙන් එකතුව රු.70,482,874 ක් පොලියක් ගෙවා තිබුණ ද අදාළ ඉඩම් අත්පත් කර ගැනීමේ අරමුණු වෙනුවෙන් භාවිතා කර නොතිබුණු බැවින් අදාළ පොලී වියදම් නිෂ්කාර්ය වියදම් වී තිබුණි.

## 3.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව බැරකම් පියවීමේ ක්‍රියාවලිය ආවරණය වන පරිදි සිගාස් ගිණුම්කරණ පද්ධතිය යාවත්කාලීන කළයුතු වුවද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වැය විෂයයන් 02 කට අදාළව එකතුව රු.15,684 ක් වූ බැරකම් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

## 3.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශ 22 කින්, දෙපාර්තමේන්තු 22 කින් හා අනෙකුත් ආයතන 02කින් සමාලෝචිත වර්ෂයේදී පිළිවෙලින් රු.3,313,327,087ක්, රු.281,932,497 ක් හා රු.6,149,026ක් ලෙස එකතුව රු.3,601,408,610 ක්වූ ප්‍රතිපාදන මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ලැබී තිබුණි. එම ප්‍රතිපාදනවලින් සමාලෝචිත වර්ෂය අවසන් වනවිට පිළිවෙලින් රු.3,139,885,497ක් රු.255,430,134ක් හා රු.5,650,762 ක් ලෙස එකතුව රු.3,400,966,393 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව පිළිවෙලින් රු.173,441,590 ක් , රු.265,023,363ක් හා රු.498,264ක් ලෙස එකතුව රු.200,442,217 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබූ අතර ලද ප්‍රතිපාදනවල ප්‍රතිශතයක් ලෙස එය පිළිවෙලින් සියයට 5.23ක්, සියයට 9.4 ක් , සියයට 8.1 ක් හා එකතුව සියයට 5.56 ක් විය.

(ආ) සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රජා සවිබලගැන්වීමේ ජාතික වැඩසටහන 2025-2029 යටතේ අස්වැසුම ප්‍රතිලාභී පවුල් හා අඩු ආදායම්ලාභී පවුල් ක්ෂුද්‍ර ව්‍යාපාර/ස්වයං රැකියා මඟින් සවිබල ගැන්වීම සඳහා ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කර තිබුණි. 2025 ජූනි 26 දිනැති හා අංක 2025/07 දරන සමෘද්ධි චක්‍රලේඛයේ උපදෙස් අනුව අස්වැසුම ප්‍රතිලාභීන් අතුරින්, දූප්පත් හා අන්ත දූප්පත් කාණ්ඩවල ප්‍රතිලාභීන් සවිබලගැන්වීම යටතේ මාතර දිස්ත්‍රික්කය තුළ ව්‍යාපෘති 367 ක් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් එකතුව රු.18,350,000 ක්වූ ප්‍රතිපාදන ලැබී තිබුණ අතර සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ඉන් ව්‍යාපෘති 349 ක් පමණක් ක්‍රියාත්මක කර එකතුව රු.15,879.312 ක් වැයකර තිබුණි. අනුමත ව්‍යාපෘති 18 ක් ක්‍රියාත්මක කර නොතිබුණු නිසා එකතුව රු.2,470,688 ක්වූ ප්‍රතිපාදන උපයෝජනය වී නොතිබුණි.

(ඇ) **විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම**

(i) මාතර දිස්ත්‍රික්කයෙන් විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට 1998 සිට 2025 වර්ෂය දක්වා කාලය තුළදී සාමාජිකයින් 30,930 ක් දායක වී තිබුණු අතර, ලියාපදිංචි වී තිබුණු මුළු සාමාජිකයින්ගෙන් සියයට 90 ක්වූ සාමාජික ගිණුම් අක්‍රිය ගිණුම් වී තිබුණි. එම සාමාජිකයින් වෙනුවෙන් විගණිත දින වන විට එකතුව රු.මිලියන 853.8 ක් ලැබිය යුතුව පැවතුණි.

(ii) 2025 අගෝස්තු මාසය වනවිට ක්‍රියාකාරී ලෙස හඳුනාගෙන ඇති, මාසික වාරික ගෙවීම් ක්‍රමය තෝරාගත් සාමාජිකයින් 135 ක් සාමාජිකත්වය ලබාගෙන මාස 02 ත් 11 ත් අතර කාලයක් ගත වී තිබුණත් එක් වාරිකයක් පමණක් ගෙවා තිබුණි. ඒ අනුව අදාළ සාමාජිකයින් සක්‍රිය සාමාජිකයින් බවට පත්කර ගැනීමට වගකිව යුතු නිලධාරීන් කටයුතු කර නොතිබුණු බැවින් අදාළ සාමාජිකයින්ගේ ගිණුම්ද අක්‍රිය තත්ත්වයට පත්වීමේ අවධානමක් පැවතුණි. විගණිත දින වන විට විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ පනත යටතේ ලියාපදිංචි වී ඇති සක්‍රිය සාමාජිකයින් ගෙවා ඇති මුළු මුදල රු.මිලියන 92.6 ක් වුවත් සාමාජිකයින්ගෙන් අයවිය යුතු සමුච්චිත වටිනාකම හා හිඟ ශේෂය නිවැරදිව දත්ත පද්ධතියට ඇතුළත් කර නොමැති බැවින් මෙම ක්‍රියාකාරී සාමාජිකයින්ගෙන් ලැබිය යුතු එකතු හිඟ ශේෂය නිවැරදිව ලබා ගැනීමට නොහැකිවුණි.

(ඈ) 2024 වර්ෂයේදී දකුණු පළාත් කෘෂිකර්ම, වාරිමාර්ග, ගොවිජන සංවර්ධන,ජල සම්පාදන හා ජල ප්‍රවාහන,ආහාර සැපයුම් හා බෙදාහැරීම් සහ වෙළඳ හා සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය විසින් මාතර අකුරැස්ස මාණික්ගොඩ ජල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් රු.4,434,365 ක් ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවට ලබා දී තිබුණි. විගණිත දින වනවිට ව්‍යාපෘතිය වෙනුවෙන් මුදල් නිදහස් කර මාස 16 ක් ඉක්ම ගොස් තිබුණද, රු.1,087,372 ක් වටිනා ජලනල උපාංග මිලදීගෙන පුද්ගලයෙකුගේ නිවසක නිශ්කාර්යව ගබඩා කර තිබුණු අතර, ඉතිරි මුදල රු.3,346,992 ක් ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ පොදු තැන්පතු ගිණුමේ රඳවා තිබුණු බැවින් ව්‍යාපෘතියේ අරමුණු සඵලදායීව ළඟාකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ඉ) සමෘද්ධි ප්‍රජාමූල බැංකු මගින් ණය ලබාදීම යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යල 15 කට අයත් සමෘද්ධි බැංකු මගින් ණයලාභීන් 4057 සඳහා ලබාදී තිබුණු එකතුව රු.350,552,052 ක්වූ ණය නියමිත කාලසීමාව තුළ අය නොවීම නිසා කල්පසු වූ ණය බවට පත්වී තිබුණි. ණයලාභීන් 2676 කට ලබාදුන් එකතුව රු.337,258,713 ක්වූ ණය ආපසු අයකර ගැනීමට නොහැකිවීම නිසා බොල්ණය බවට පත්වී තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට ණයලාභීන් 6783 දෙනෙකුට ලබාදුන් ණය මුදල් ආපසු අයකර ගැනීමට වගකිවයුතු නිලධාරීන් සමත් නොවීම නිසා සමෘද්ධි බැංකුවලට එකතුව රු.349,952,052 ක මූල්‍ය පාඩුවක් සිදුවී තිබුණි.

(ඊ) ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන 2019 යටතේ මාර්ග 03 ක් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් සභා, පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක HAF/F/DA/ 48/Audit/QG/2022/ R.D-Matara දරන හා 2023 ජූනි 04 දිනැති ලිපිය මගින් දන්වා තිබුණු උපදෙස් අනුව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූල නොවන ගෙවීම් කළ තාක්ෂණ කමිටු හා ප්‍රසම්පාදන කමිටු දීමනා නැවත අයකිරීම් කළ යුතු වුවත්, එසේ කටයුතු කර නොතිබුණු අතර, රජයට සිදු වී තිබුණු පාඩුව රු.18,575,593 ක් ආපසු අයකර ගැනීමේ ප්‍රගතිය 2023 ජූනි 15 දිනට පෙර අමාත්‍යාංශය වෙත වාර්තා කළ යුතු වුවත්, එසේ කටයුතු කර නොතිබුණි.

(උ) **දිට්වා සුළි කුණාටු තත්ත්වයේ බලපෑම්**

පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(i) 2025 නොවැම්බර් මස 27 හා 28 දින ශ්‍රී ලංකාවට බලපෑ "දිට්වා" සුළි කුණාටු සුළි කුණාටු තත්ත්වයෙන් බලපෑමට ලක්මට ලක්වූ ජනතාව නඟා සිටුවීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ 103 හා කර්මාන්ත අමාත්‍යාංශයේ 149 වැය ශීර්ෂයන්ගෙන් මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට සමාලෝචිත වර්ෂයේදී රු.28,530,125 ක ප්‍රතිපාදන දී තිබුණු අතර ඉන් රු.22,248,963 ක් උපයෝජනය කර තිබුණි.

(ii) පූර්ණ හානි නිවාස වෙනුවෙන් පළමු අදියර යටතේ රු.2,000,000 ක් දක්වා වන්දි මුදල් ගෙවිය හැකි වුවත්, අදාළ හානි තක්සේරු කර ප්‍රතිලාභියා වෙත වන්දි මුදල් ගෙවීමට විගණිත දිනය වන විටත් කටයුතු කර නොතිබුණි.

### 3.4 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කරගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදුකළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික වියයුතු වුවත්, වාර්තාවේ 4.6 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි.

### 3.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| | -------------------- | -------------------- |
| (ඈ) | ව්‍යවස්ථාපිත විධිවිධාන | |
| | ------------- | |
| (i) | 1979 අංක 07 දරන රජයේ ඉඩම් සන්තකය නැවත ලබා ගැනීමේ පනත | හක්මණ හා අතුරලිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල සතු ඉඩම් කැබලි 23 ක් බාහිර පුද්ගලයින් විසින් අනවසරයෙන් බුක්ති විඳින නමුත් ඒවායේ සන්තකය ආපසු ලබාගෙන නොතිබුණි. |
| (ii) | අනවසරයෙන් රජයේ ඉඩම් අල්ලා ගැනීම වැළැක්වීම සඳහා පනවා තිබූ 1947 අංක 08 දරන රජයේ ඉඩම් ආඥා පනතේ ඉඩම් නියෝග අංක 180 | සෑම ග්‍රාම නිලධාරීවරයෙකුම, අනවසර අල්ලාගැනීම් පිළිබඳ ලේඛනයක් පවත්වාගත යුතු අතර, ඒ පිළිබඳව ප්‍රාදේශීය ලේකම් වෙත ග්‍රාම නිලධාරී විසින් දෙසතියකට වරක් වාර්තාවක් ඉදිරිපත් කළයුතු නමුත් දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වසම් 37 ක ග්‍රාම නිලධාරීන් 37 දෙනෙකු විසින් 2025 වර්ෂයේ දෙසති වාර්තා කිහිපයක් ඉදිරිපත් කර නොතිබුණි. ඒ අනුව අනවසර අල්ලාගැනීම් වැළැක්වීම සඳහා හඳුන්වාදී තිබූ පාලන ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා ද එම නිලධාරීන් විසින් කටයුතු කර නොතිබූ අතර ඒ සම්බන්ධයෙන් ආයතන ප්‍රධානී විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබූ බව ද නිරීක්ෂණය විය. |

(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ

-----------------

| | | |
|---|---|---|
| (i) | 2001 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරන රාජ්‍ය චක්‍රලේඛය | දික්වැල්ල, දෙවිනුවර, හක්මණ, කිරින්ද පුහුල්වැල්ල, අතුරලිය හා මාලිම්බඩ යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක නිලධාරීන් 370 දෙනෙකු අවුරුදු 05 ක කාලසීමාව ඉක්මවා එනම් අවුරුදු 01 ත් 28 ත් අතර කාලයක් ස්ථාන මාරුවීමෙන් තොරව එකම සේවා ස්ථානයේ රැදී සිටින බව නිරීක්ෂණය විය. |
| (ii) | 2023 නොවැම්බර් 30 දිනැති හා අංක 02/2018(I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2024/2025 වර්ෂය සඳහා වූ මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කොට නොතිබුණි. |
| (iii) | 2025 සැප්තැම්බර් 01 දිනැති හා අංක 05/2008(ii) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | රාජ්‍ය ආයතන විසින් මහජනයා වෙත ලබාදෙන සේවාවන් වඩාත් විනිවිදභාවයෙන් යුතුව කාර්යක්ෂම හා ඵලදායී අයුරින් ලබාදීමට වගවීමටත් ඒ සඳහා සම්බන්ධ වන්නා වූ සියළු පාර්ශවයන් අතර මනා අවබෝධය සහ එකිනෙකා අතර විශ්වාසය වැඩිදියුණු කිරීම උදෙසාත් සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම තම ආයතන සඳහා වන පුරවැසි /සේවාලාභී ප්‍රඥප්තිය (ඇමුණුම 01 පරිදි) සකස් කර ප්‍රකාශයට පත්කළ යුතු වුවද, දෙවිනුවර, දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් පුරවැසි /සේවාලාභී ප්‍රඥප්තියක් සකස්කර නොතිබුණි. |

(ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2024

-----------------

| | | |
|---|---|---|
| (i) | 2024 හි 3.2 වගන්තියේ | නැවත ඇණවුම් කිරීමේදී අවශ්‍ය අතිරේක ප්‍රමාණය මුල් ප්‍රසම්පාදනයෙන් සියයට 50 කට වඩා අඩු වියයුතු වුවත්, ඊට අනුකූල නොවී දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එකතුව රු.822,215 ක් වටිනා භාණ්ඩ මිලදීගෙන තිබුණි. |
| (ii) | 2024 හි 13.1 වගන්තිය | මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඇතුළු ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 විසින් විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන (e-GP) ක්‍රමවේදය ක්‍රියාත්මක කර නොතිබුණි. |
| (iii) | ප්‍රසම්පාදන අත්පොත 2024 හි 5.23 | භාණ්ඩ සඳහා පැහැදිලි හා සවිස්තරාත්මක පිරිවිතරයන් ලංසුකරුවන්ට ඔවුන්ගේ ලංසු / යෝජනා සුදුසුකම් ලැබීමකින් හෝ කොන්දේසිගත කිරීමකින් තොරව ප්‍රසම්පාදන අස්ථිත්වයෙහි අවශ්‍යතාවලට තත්ත්වාකාරයෙන්ම සහ තරඟකාරී ලෙස ප්‍රතිචාර දැක්වීම සඳහා වන අවශ්‍යතාවයක් බැවින් ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් ඉදිරිපත් කළයුතු වුවද, දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මිල පිරිවිතරයන් ඉදිරිපත් කිරීමෙන් තොරව එකතුව රු.361,899 ක් වටිනා භාණ්ඩ මිලදීගෙන තිබුණි. |

(ඈ) කළමනාකරණ විගණන චක්‍රලේඛ

-------------------

| | | |
|---|---|---|
| (i) | 2025 අප්‍රේල් 28 දිනැති හා අංක DMA/01/2025 දරන කළමනාකරණ | අභ්‍යන්තර විගණන නිලධාරීන් පිළිබඳ පරීක්ෂාවේදී නිලධාරීන් විසින් අභ්‍යන්තර විගණනයේ පරමාර්ථ හා අරමුණු ළඟාකර ගැනීම සම්බන්ධයෙන් කටයුතු නොකරන බව එක් එක් අභ්‍යන්තර විගණන නිලධාරීන් ඉටුකර තිබුණු රාජකාරි වැඩ |

| | | |
|---|---|---|
| | විගණන චක්‍රලේඛයේ අංක 1.3 ඡේදය | සම්බන්ධයෙන් සිදුකළ පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. |
| (ii) | 2025 අප්‍රේල් 28 දිනැති හා අංක DMA/01/2025 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 05 ඡේදය | අභ්‍යන්තර විගණන ඒකකයන් සඳහා විගණන කාර්ය මණ්ඩලය ලබාදීමේදී හැකි සෑම විටම ගිණුම් හා විගණන විෂය පිළිබඳ දැනුම ඇති නිලධාරීන් ලබාදීම පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ගේ සහ ගණන්දීමේ නිලධාරීන්ගේ විශේෂ අවධානය යොමුකළ යුතු බවත්, ඒ තුළින් අභ්‍යන්තර විගණන ඒකකයන්හි කාර්යසාධනය ඉහළ නංවා ගැනීමට හැකි බවත් දක්වා තිබුණි. කෙසේ වුවත්, ඊට අනුකූලව කටයුතු කර නොතිබුණු අතර, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 ක් සඳහා අනුයුක්කර තිබුණු අභ්‍යන්තර විගණන නිලධාරීන් 17 දෙනෙකු ගිණුම් හා විගණන විෂය පිළිබඳ දැනුම ඇති නිලධාරීන් නොවන බව ඔවුන්ගේ අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. |
| (ඉ) | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 03/2022 දරන හා 2022 ජූනි 10 දිනැති චක්‍රලේඛය 03 (ඈ) ඡේදය හා 07 ඡේදය | වැඩිපුර ගෙවූ විශ්‍රාම වැටුප් ද රජයට සිදුවූ පාඩුවක් බැවින් මුදල් රෙගුලාසි 101 සිට 113 දක්වා වූ ක්‍රියාමාර්ග අනුගමනය කර විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ හානි ලේඛනයට වාර්තා කළ යුතු බවත් විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීමක් හෝ වංචාවන් සම්බන්ධයෙන් අත්‍යවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට ප්‍රාදේශීය ලේකම්වරු කටයුතු කළයුතු අතර, ඒ සඳහා මුදල් රෙගුලාසි 101 සිට 113 දක්වා වූ විධිවිධාන හා ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ විධිවිධාන අනුගමනය කළ යුතු වුවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 ක විශ්‍රාම වැටුප් |

| | | |
|---|---|---|
| | | ගෙවීමේදී වැඩිපුර ගෙවා තිබුණු රු.21,814,253 කින් 2026 මැයි 20 දිනට රු.4,165,634 ක් තව දුරටත් අයවීමට තිබුණි. |
| (ඩ) | 2021 ජූලි 20 දිනැති හා අංක 2021/05 දරන ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛයේ 02 වගන්තිය හා 2008/4(1) දරන චක්‍රලේඛය | සුනාමි ඉඩම් ප්‍රතිලාභීන් නොවන වෙනත් පාර්ශවයන් සුනාමි නිවාස 116 ක් බුක්ති විඳිනු ලැබුවත් එම පාර්ශවයන්ට එරෙහිව අදාළ නීති රීති හා රෙගුලාසිවලට අනුකූලව කටයුතු කිරීමට වගකිව යුතු නිලධාරීන් සමත් වී නොතිබුණි. |
| (ඪ) | ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය විසින් 2024 නිකුත් කරන ලද චක්‍රිය ණය උපදෙස් මාලාවේ (v) හි අංක 2.5.2 ඡේදය | ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය යටතේ ග්‍රාමීය කාන්තාවන් ආර්ථිකමය වශයෙන් සවිබල ගන්වා ජීවන තත්ත්වය ඉහළ නැංවීමේ අරමුණින් චක්‍රිය ණය මුදල් මාසික වාරික 10 කින් ගෙවා නිමකළ යුතු වුවත් 2011 සිට 2024 දක්වා ගෙවන ලද රු.3,429,000ක්වූ ණයවලින් රු.978,811 ක්වූ ණය ගෙවා වසරක් ඉක්මවූ පසුවත් තවදුරටත් අයවීමට තිබුණි. |
| (ණ) | ආරක්ෂක අමාත්‍යාංශයේ ආපදා කළමනාකරණ අංශයේ අතිරේක ලේකම්ගේ අංක NDRSC/01/02/03 /RS/පොදු ගොනුව | හක්මණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නැවත පදිංචි කිරීමේ වැඩසටහන යටතේ නිවස ඉදිකිරීමේ කටයුතු සඳහා එක් එක් වාරිකයෙහි වැඩ නිමකිරීම සඳහා කාලය බෙදා ලබාදී තිබුණු අතර මාස 06 ක් තුළ ඉදිකිරීම් කටයුතු නිම කිරීමට කාලය ලබාදී තිබුණි. 2019 හා 2023 යන වර්ෂවල ආපදාවට ලක්වූ පුද්ගලයන් 04 දෙනෙකු ගිවිසුම් ප්‍රකාරව නිවාසවල වැඩ අවසන් කර පදිංචිවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන |

| | | |
|---|---|---|
| | 01 දරන හා 2025 මාර්තු 02 දිනැති 2025 වර්ෂයේ ප්‍රතිපාදන වෙන් කිරීමේ ලිපිය | නොතිබුණු බැවින් ප්‍රතිලාභීන්ට නිදහස් කර තිබුණු එකතුව රු.2,200,000 ක් නිශ්කාර්ය වියදම් වී තිබුණි. |
| (එ) | බහුකාර්ය සංවර්ධන කාර්ය සහායක බලකා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියේ v වන වගන්තිය | ස්ථිර පත්වීම් භාර ගැනීම සඳහා නිදහස් කළ දින සිට බහුකාර්ය සංවර්ධන කාර්ය සහායකයින්ට නැවත එම දෙපාර්තමේන්තුව යටතේ රාජකාරි කළ නොහැකි බවත් කිසිදු දීමනාවක් හෝ නිවාඩු හිමිකමක් නොවන බවත් දන්වා තිබුණි. හක්මණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එවැනි සේවකයින් 07 ක් 2024 මැයි සිට 2025 මැයි දක්වා එකතුව රු.1,825,304 ක් වූ වැටුප් දීමනා ගෙවා තිබුණු අතර, අදාළ කාලය තුළදී නිලධාරීන් විසින් නිවාඩු 444 ක්ද ලබාගෙන තිබුණි. |

**3.6 තත්ත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම හා පියවීම**

මුදල් රෙගුලාසි 371(5) ප්‍රකාරව අතුරු අග්‍රිමයක් නිකුත් කිරීමෙන් පසු අදාළ කාර්යය අවසන් කර දින 10 ක් තුළ එම අතුරු අග්‍රිමය නැවත පියවිය යුතු වුවත්, ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. අතර, ඒ අනුව අවස්ථා 13 දී නිලධාරීන්ට නිකුත් කර තිබුණු එකතුව රු. 235,187 ක් වූ අතුරු අග්‍රිම පියවීමට දින 14 ත් දින 45 ත් අතර කාල ප්‍රමාද වී තිබුණි.

**3.7 තැන්පතු**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තැන්පත් කළ දින සිට වසර 02 ක කාලයක් ඉක්මවූ එකතුව රු.2,817,573 ක තැන්පතු ශේෂ 15 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණු අතර, ඉන් එකතුව රු.1,813,435 ක්වූ තැන්පතු ශේෂ 02 ක් තැන්පත් කළ දින සිට වසර 05 ක් ඉක්මවා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 සැලැසුම් කිරීම

2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වේ. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා තවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 ක ආයතන, පාලන, මූල්‍ය, සංවර්ධන, ඉඩම්, ක්‍රමසම්පාදන, කුඩා ව්‍යාපාර සංවර්ධන, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය, විද්‍යා සම්පත් මධ්‍යස්ථාන, මානව සම්පත් සංවර්ධන, විදේශ රැකියා, බෞද්ධ කටයුතු, සංස්කෘතික, ජාතික ඒකාබද්ධතා, සමාජසේවා, වනිතා, ළමා හිමිකම්, වැඩිහිටි, ප්‍රජා විශෝධන, තරුණ කටයුතු, සමෘද්ධි, ග්‍රාම සංවර්ධන, ළමා, පරිසර අංශය, සමාජ ආරක්ෂණ, උපදේශන, කෘෂිකර්ම, සමාජසේවා යනාදි  එක් එක් අංශය මගින් සැලසුම් කළ ක්‍රියාකාරකම් නියමිත පරිදි ඉටුකර, අපේක්ෂිත කාර්යසාධනයට ලඟාවී නොතිබුණි.

#### 4.1.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

මුලටියන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රවේශ මාර්ගය ඇස්පෝල්ට් අතුරා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියට අදාළ මාර්ග සංවර්ධන අධිකාරියේ රසායනාගාර පරීක්ෂණ වාර්තාව අනුව ඇතිරූ ඇස්පෝල්ට්වල ඝණකම අස්තමේන්තු කළ ප්‍රමාණයට වඩා 12mm ක් අඩුවෙන් පැවතුණි.  පරීක්ෂණාගාර වාර්තාව මගින් ඇස්පෝල්ට් කොන්ක්‍රීට්වල සම්පීඩන ඝණත්වය (Degree of Compaction) පිලිබඳව පරීක්ෂා කර නොතිබුණු අතර, Marshall Density පරීක්ෂා කිරීමට අදාළ Sample ලබා නොගැනීම ඊට හේතු වී තිබුණි.  ඒ අනුව ඉදිකිරීම් පුහුණු හා සංවර්ධන ආයතනය (ICTAD) විසින් ප්‍රසිද්ධ කරන ලද ඉදිකිරීම් සම්බන්ධ සම්මත පිරිවිතරයන් (SCA/5) අනුව ඉදිරිකිරීම් සම්මත ප්‍රමිතීන්ට අනුකූල නොවන තත්වයන් පැවතියදී, අදාළ වැඩ විෂයය වෙනුවෙන් රු.806,235 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා රජයට අලාභ සිදුකර තිබුණු අතර, මාර්ගයේ අපේක්ෂිත සේවා කාලය (design life) අඩු වීමට බලපෑම් ඇති විය හැකි බැවින් ව්‍යාපෘතිය වෙනුවෙන් වැයකර තිබුණු රු.1,942,463 ක් නිෂ්කාර්ය වියදම් වී තිබුණි.

### 4.1.3 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

2021 සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ හක්මන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරි වසම් 10 ක ආරම්භ කර තිබුණු ව්‍යාපෘති 05 ක් විවිධ හේතූන් නිසා ක්‍රියාත්මක කිරීම අතරමග නවතා තිබුණු නිසා අදාළ වැඩසටහනේ අරමුණු සඵලදායීව ළඟාකර ගැනීමට නොහැකි වී තිබුණු අතර, ඒ වෙනුවෙන් වැයකර තිබුණු එකතුව රු. 4,247,202 ක් නිෂ්කාර්ය වියදම් වී තිබුණි.

### 4.1.4 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

අත්‍යවශ්‍ය වාරිමාර්ග සංවර්ධනය කිරීම් හා දියලජේ දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ අළුත්වැඩියාව යන වැඩසටහන් යටතේ කඹුරුපිටිය, හා අකුරැස්ස යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක ව්‍යාපෘති 02 ක් සඳහා එකතුව රු.7,171,926 ක්වූ ප්‍රතිපාදන ලැබී තිබුණු සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබුණු බැවින් මහජන සුබසාධනය අහිමි වී තිබුණි.

### 4.2 දේශීය අරමුදල් යෙදවූ ව්‍යාපෘති

විමධ්‍යගත අයවැය වැඩසටහන - 2025 යටතේ මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සුල්තානාගොඩ වැවේ ජලය නිකුත් කරනු ලබන ප්‍රධාන ඇළ මාර්ගය මීටර් 25 ක් කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තය ඉටුකිරීම වෙනුවෙන් පුද්ගලික කොන්ත්‍රාත් ආයතනයක් සමග රු.1,428,702 ක ගිවිසුමකට එළඹ තිබුණු අතර කොන්ත්‍රාත්කරු විසින් ඉදිකර තිබුණු හා කොන්ක්‍රීට් කරන ලද ඇළ මාර්ගය (කානුව) සම්මත ප්‍රමිතීන්ට අනුව ඉදිකර නොතිබුණි. ඒ සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමට පත්කළ ස්වාධීන පරීක්ෂණ කමිටුව විසින් අදාළ ඉදිකිරීම් නියමිත ප්‍රමිතියෙන් තොර බවට නිර්දේශ ලබා දී තිබුණු බැවින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තාක්ෂණික නිලධාරීන් ඇතුළු වගකිව යුතු නිලධාරීන්ගේ අධීක්ෂණය හා සුපරීක්ෂණය ඉතා දුර්වල මට්ටමක පැවතුණි.

### 4.3 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොටපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කඳුකර දශකය වැඩසටහන 2024 යටතේ පෙර පාසල් සඳහා ස්මාර්ට් රූපවාහිනී මිලදී ගැනීමේදී තාක්ෂණික ඇගයීම් කමිටුව විසින්, පිරිවිතරයන්ට අනුකූලව සාරානුකූලව ප්‍රතිචාර දක්වා තිබුණු

සැපයුම්කරුගේ අවම මිල ගණන්, "වගකිම් කාලය ඉදිරිපත් කර නොමැත" යනුවෙන් සාවද්‍ය කරුණු දක්වා ප්‍රතික්ෂේප කර, වැඩි මිලට භාණ්ඩ මිලදී ගැනීම නිසා රු.113,019 ක මූල්‍ය පාඩුවක් රජයට සිදුකර තිබුණි.

(ආ) සමෘද්ධි ප්‍රජාමූල බැංකු 04 ක් සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර 04 ක් පුද්ගලික සමාගමකින් මිලදීගෙන තිබුණු අතර, පිරිවිතරයන්ට අනුව අනෙකුත් ආයතන සේවා නොසැපයීම පිළිබඳව තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් තොරතුරු සැසඳීම සිදු නොකර මිලදී ගැනීම නිසා රු.141,600 ක් වැඩිපුර ගෙවීමට සිදුවී තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2006 හි 1.2.1 හි දැක්වෙන අරමුණු ඉටුකර ගැනීම රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමෙන් සහතික වියයුතු අතර, සැපයුම්කරුවන්ගේ ලංසු මිල ගණන් කැඳවීමේදී යොමුකර තිබුණු පිරිවිතරයන්ට අනුකූලව හා සාරානුකූලව අවම මිල ගණන් ඉදිරිපත් කර තිබුණු ලංසුකරුවන්ගේ මිල ගණන් ප්‍රතික්ෂේප කර ලංසු කැඳවීමේ ලේඛන හා පිරිවිතරවල ඇතුළත් නොවූ කරුණු මත පදනම්ව භාණ්ඩ මිලදී ගැනීමේදී දික්වැල්ල හා දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් භාණ්ඩ, උපකරණ මිලදී ගැනීමේදී එකතුව රු.1,133,071 ක් වැඩිපුර ගෙවා රජයට අලාභ සිදුකර තිබුණි.

## 4.4 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) හක්මණ සහ දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාල සතු එකතුව වර්ග මීටර් 421.90 ක් වූ නිල නිවාස 03 ක් ද, පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු හෙක්ටයාර් 1.83 ක් වූ ඉඩම් කැබලි 04 ක් ද, භාවිතයෙන් තොරව නිශ්කාර්යව පැවතුණි.

(ආ) 2014-2016 කාල පරිච්ඡේදය තුළදී දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දූවවත්ත බතිගම ප්‍රදේශයේ පර්චස් 10 ක පමණ භූමි ප්‍රමාණයක ඉදිකර වැඩ අවසන් කර නොතිබුණු මහල් දෙකකින් යුතු සේවා පියසේ හා 2024 වර්ෂයේදී ඉදිකිරීම් ආරම්භ කර තිබුණු බඹරැන්ද නැගෙනහිර පොල්ගහමුල්ල වැල්ලවත්ත මුහුදු වෙරළ පාර පිහිටි ගොඩනැගිල්ලේ වැඩ අවසන් කර නොතිබුණු අතර,

අත්‍යවශ්‍ය පහසුකම් සම්පූර්ණ නොකිරීම මත ඒවා භාවිතයෙන් තොරව නිශ්කාර්යව පැවතුණි. ගොඩනැගිලිවල පිරිවැය ගණනය කිරීමට අදාළ තොරතුරු හා සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවූ අතර, අදාළ ඉදිකිරීම් වෙනුවෙන් වැයකර තිබුණු රජයේ මුදල් නිෂ්කාර්ය වියදම් වී තිබුණි.

(ඇ) ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන -2019 යටතේ රු.495,160 ක් වැයකර තිබබොටුවාව දිලෙන තරු ක්‍රීඩා සමාජයට 2019 ඔක්තෝබර් 14 දින ලබා දී තිබුණු කායවර්ධන උපකරණ අයිතම 43 ක් භාවිතයෙන් තොරව නිශ්කාර්යව තිබුණු බැවින් ඒවා මිලදී ගැනීමට වැයකර තිබුණු රජයේ මුදල් නිශ්කාර්ය වියදම් වී තිබුණි.

## 4.5 පාඩු හා හානි

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2019 වර්ෂයේ දී මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වතුර මෝටරය අස්ථානගත වීමෙන් සිදු වූ පාඩුව තක්සේරු කිරීමකින් තොරව 2025.02.06 දින පොත්වලින් ඉවත්කර තිබූ බව නිරීක්ෂණය වූ අතර මූල්‍ය ප්‍රකාශනයෙහි ඇමුණුම - (ii) පොත්වලින් කපාහැරීම පිළිබඳ ප්‍රකාශයේ වටිනාකමක් රහිතව දක්වා තිබුණි.

(ආ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක එකතුව රු.6,379,549 ක්වූ අලාභ 09 ක් සිදුවී වසර 01ත් 04ත් අතර කාලයක් ගත වී තිබුණද මුදල් රෙගුලාසි 104(4) හා 156(1) ප්‍රකාරව කටයුතු කොට එම ගොනුවල කටයුතු අවසන් කර නොතිබුණි.

## 4.6 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 03 කට 2026 මැයි 22 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුම්වලට අදාල ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.9,285,673 ක් විය.

## 4.7 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෙනියායේ පදිංචි පුද්ලයෙකුගේ ඉඩම අධි අවදානම්වීම හේතුවෙන් එම පුද්ගලයින් දික්වැල්ල ප්‍රාදේශිය ලේකම් කාර්යාල බල ප්‍රදේශයේ පදිංචි කරවීම සඳහා රජයේ තක්සේරුකරුවෙකුගේ තක්සේරු වාර්තාවක් හා නිවාස සැලසුම් වෙනුවෙන් පළාත් පාලන ආයතනයේ අනුමැතිය නොමැතිව පර්චස් 7.40 ක ඉඩම සමඟ නිවස මිලදී ගැනීමට 2024 දෙසැම්බර් 26 දින වවුචර් අංක 241 මගින් රු.1,600,000 ක මුදලක් ලබාදී තිබුණ ද එම ඉඩම සඳහා අදාළ ගෙවීම් සිදුකර තිබුණි. දිස්ත්‍රික් ලේකම්ගේ 2024 දෙසැම්බර් 23 දිනැති හා අංක DSM/FLD/Relief/3/17/5 දරන නැවත පදිංචි කිරීමේ ලිපිය මගින් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් ලබාදී තිබුණු නිර්දේශ අනුව වර්ග අඩි 175 ක නිදන කාමරයක් ඉදිකිරීම සහ විදුලි සැපයුම මසක් තුළ ලබා ගැනීමේ පොරොන්දුව මත ඉඩම මිලදී ගැනීමට අදාළ කටයුතු කිරීමට උපදෙස් ලබාදී තිබුණු අතර 2025 නොවැම්බර් 25 දින දක්වාම ඊට අනුකූලව කටයුතු සිදුකර නොතිබුණි.

(ආ) ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ අංක NBRO/LARMD/ MTR/DE/ ERR/ 2023/23 දරන 2023 ඔක්තෝබර් 18 දිනැති වාර්තාව අනුව දෙවිනුවර මධ්‍යම ග්‍රාම නිලධාරී වසමේ පදිංචි පවුල් 03 ක් හා හක්මණ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ පදිංචි පවුල් 13 ක් නායයාම් අධි අවදානම මත පදිංචි ස්ථානයෙන් ඉවත්වන ලෙස නිර්දේශ කර තිබුණ ද, එම පුද්ගලයින් නැවත පදිංචි කිරීමට අදාළ විකල්ප අවස්ථාවන් තෝරා නොගැනීම හේතුවෙන් ආපදාවලට ලක්වූ ස්ථානවලම තවදුරටත් ජීවත්වන බව විගණනයට නිරීක්ෂණය විය.

(ඇ) 2004 වර්ෂයේ සුනාමි ව්‍යසනයෙන් විපතට පත්වූවන්ට නිවාස ලබාදීමේ පරමාර්ථයෙන් රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන සහ ශ්‍රී ලංකා රජය ඒකාබද්ධව ක්‍රියාත්මක කර තිබුණු සුනාමි ව්‍යාපෘතිය යටතේ දික්වැල්ල, මාතර කඩවත්සතර හා දෙවිනුවර ප්‍රාදේශිය ලේකම් බල ප්‍රදේශ තුළ සුනාමි නිවාස සංකීර්ණ 24 ක නිවාස 899 ක් විපතට පත්වූවන්ට ලබා දී වසර 20 ක කාලයක් ගතවී තිබුණත්, නිවාසලාභීන් 195 ක් සඳහා දිමනාපත්‍ර සකස්කර නිවාස අයිතිය ලබාදීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) දික්වැල්ල ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ විදුලි බිල් ගිණුම් 02 කට අදාලව 2024 ජුනි හා 2024 සැප්තැම්බර් මාසයට අදාළ ගාස්තු නියමිත දිනට ගෙවීමට කටයුතු නොකිරීම හේතුවෙන් දිගින් දිගටම ගෙවිය යුතු රු.89,267 හිඟ ශේෂය මුදල් රෙගුලාසි අංක 102(ඇ) ප්‍රකාරව රජයේ නිලධාරීන්ගේ නොසැලකිල්ල,

අපරික්ෂාකාරී බව, ප්‍රමාදය හෝ අතපසුවීම නිසා සිදුවන අලාභහානිවලට වන්දි ගෙවීම වශයෙන් දරනු ලබන වියදම් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කළයුතු වුවත්, ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි.

(ඉ) කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගිණුම් අංශයේ සරප් නිලධාරී විසින් සිදුකර තිබුණු මුදල් වංචාව අනාවරණය වී මාස 10 ක් ඉක්ම ගියද, මුදල් රෙගුලාසි 128(1)(ජ) ප්‍රකාරව වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගැනීමට සමත් වී නොතිබුණි.

(ඊ) දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් නාඹටුන්න ගොරකපදුරගේන රජයේ ඉඩම සුදුසුකම්ලාභීන්ට බෙදාදීම සඳහා ගොවි පන්තිය යටතේ පවත්වන ලද ඉඩම් කච්චේරි වැඩසටහන යටතේ ඉඩම් ලබාගැනීමට සුදුසුකම් ලැබූ සුදුසුකම්ලාභීන් 47 දෙනාගෙන් 08 දෙනකු ඉඩමේ පදිංචිව සිටින බවත්, 07 දෙනෙකු නිවාස ඉදිකරමින් පදිංචිව නොමැති බවත්, 14 දෙනකු ඉඩම් සංවර්ධනය කර නොතිබුණු බවත් නිරීක්ෂණය වූ අතර, ඉතිරි 18 දෙනා සම්බන්ධ තොරතුරු හා සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි. ඒ අනුව සුදුසුකම්ලාභීන් 47 න් 39 ක් සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් ඉඩම් සංවර්ධනය කර පදිංචිය සඳහා භාවිතා කර නොතිබුණු බැවින් ඉඩම් කච්චේරි පැවැත්වීමේ අරමුණු සඵලදායීව ඉටු වී නොතිබුණි.

## 5 යහපාලනය

### 5.1 මහජනයා වෙත සේවා ඉටුකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සේවාලාභී ප්‍රඥප්තිය ප්‍රකාරව, දැව හෙලීම් බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා ගතකළ යුතු කාලය සති 02 ක් වුවත්, කිරින්ද පුහුල්වැල්ල, අතුරලිය හා දික්වැල්ල යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල 2025 වර්ෂයේදී අයදුම්පත් භාරදුන් දින සිට දැව හෙලීම් බලපත්‍රය නිකුත් කිරීම සඳහා මාස 01 ත් 05 ත් අතර කාලයක් ගෙන තිබුණි. එසේම සේවාලාභී ප්‍රඥප්තිය ප්‍රකාරව දැව ප්‍රවාහන බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා ගතවන කාලය සති 02 ක් වුවද, අයදුම්පත් භාරදී ප්‍රවාහන බලපත්‍රය නිකුත් කිරීම දක්වා මාස 01ත් මාස 03 ත් අතර කාලයක් ගෙන තිබුණි. ඒ අනුව සේවාලාභී ප්‍රඥප්තියේ සඳහන් කාලය තුළ අදාළ බලපත්‍ර නිකුත් කිරීමට ප්‍රමාදවීම

ආයතනයේ ප්‍රතිරූපයට හා විශ්වාසනීයත්වයට අයහපත් බලපෑම් ඇති කරනු බව නිරීක්ෂණය විය.

(ආ) පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය අනුව ව්‍යාපාර නාමයක් ලියාපදිංචි කිරීම, අයදුම් පත්‍රයක් ඉදිරිපත් කර සති 02 ක් තුළ සිදුකර ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ සහතිකපත්‍ර නිකුත් කළයුතු නමුත්, කිරින්ද පුහුල්වැල්ල හා දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඊට අනුකූලව කටයුතු කර නොතිබුණු අතර, ව්‍යාපාර නාමයක් ලියාපදිංචි කිරීමට දින 16 සිට 193 දක්වා කාල ප්‍රමාදයක් තිබුණි.

(ඇ) 2024 - 2025 සැප්තැම්බර් කාලය තුළදී කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත මහජනතාව විසින් ඉඩම් මැනුම් ඉල්ලීම් 35 ක් යොමුකර තිබුණු අතර, ඉන් මැනුම් නියෝග 18 ක් පමණක් විගණන දිනය වූ 2025 ඔක්තෝබර් 15 දින වනවිට සිදුකර තිබුණු අතර, තවත් ඉඩම් මැනුම් ඉල්ලීම් 17 ක් සම්බන්ධයෙන් කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු නොකිරීමෙන් මහජන සේවා ප්‍රමාද වී තිබුණි.

## 6. මානව සම්පත් කළමනාකරණය

### 6.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසන් වනවිට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 13, තෘතියික මට්ටමේ තනතුරු 07 ක් හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 04 ක් ලෙස පුරප්පාඩු 24 ක් පැවතුණි.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල තෘතියික මට්ටමේ තනතුරු 01 ක්ද, ද්විතියික මට්ටමේ තනතුරු 325 ක් හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 05 ක් වශයෙන් නිලධාරීන් 331 ක අතිරික්තයක් පැවතුණි.

එම්.ජී. මදරසිංහ
නියෝජ්‍ය විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

එම්.ජී. මදරසිංහ
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට